# 2026.06.16 දින මහ සභා රැස්වීම
## අලව්ව ප්‍රාදේශීය සභාව

2026.06.16 වන දින පෙ.ව 09.30 ට පමණ අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී පවත්වන්නට යෙදුන අලව්ව ප්‍රාදේශීය සභාවේ VII වන සැසිවාරයේ පහලොස්වන වන මහ සභා රැස්වීම පිළිබඳ සංෂිප්ත වාර්තාවයි.

**මෙදින සහභාගී වූ ගරු මන්ත්‍රීතුමන්ලා / මන්ත්‍රීතුමියන්ලා**

1. ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා
2. ගරු උප සභාපතිනි එම්.සී.එම්. නන්දසේන මැතිනිය
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. නාරද සිරිවර්ධන මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.ඒ. අනෝමා දිල්රුක්ෂි රණවීර මැතිනිය
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. උද්ධාල අරුණසිරි මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්. සුසිල් ප්‍රේමසිංහ මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එම්. අකිල මධුජිත් කුමාර මැතිතුමා
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්. ප්‍රියන්ත උපුල් කුමාර කරුණාරත්න මැතිතුමා
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එච්. ලක්ෂ්මී කාන්ති ඥාණලතා මැතිනිය
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.චමින්ද මාල් මැතිතුමා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.පී. චන්ද්‍රසිරි මිගාර් පතිරණ මැතිතුමා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. සිසිර කුමාර රාජපක්ෂ මැතිතුමා
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.පී. සිරිල් ජයවර්ධන මැතිතුමා
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එච්. සදෙව් ලක්ජය මැතිතුමා
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.එච්. කපිල පද්මසිරි යාපා මැතිතුමා
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.පී. අජන්තා නීලකුමාරි මැතිනිය
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ආර්. අනිල් කීර්ති බණ්ඩාර මැතිතුමා
24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එම්.ඒ. චන්දිමා ලක්මාලි මල්ලව ආරච්චි මැතිනිය
25. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ජේ.එච්.එම්.ලක්ෂ්මී සංජීලා ජයසුන්දර මැතිනිය

**මෙදිනසහභාගී නොවූ ගරු මන්ත්‍රීතුමන්ලා / මන්ත්‍රීතුමියන්ලා**

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. කරුණාරත්න මැතිතුමා

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**

අලව්ව ප්‍රාදේශීය සභාවේ VII වන සැසිවාරයේ පහලොස්වන වන මහ සභා රැස්වීම සඳහා පැමිණි ගරු උප සභාපතිතුමිය ප්‍රධාන සියලු ගරු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලා මා ඉතාමත් ගෞරවයෙන් යුතුව පිළිගනු ලබනවා. එමෙන්ම, අලව්ව ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය සහ එම නිළධාරීන් සියලු දෙනාත් ඉතා ගෞරවයෙන් යුතුව පිළිගනු ලබනවා.

**01.පසුගිය මහ සභා රැස්වීම් වාර්තාව සම්මත කිරීම**

**2026.05.19 දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව සම්මත කිරීම**

**ගරු සභාපති පී.ජී.අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
2026.05.19 දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව ඔබතුමන්ලා වෙත ලබාදී තිබෙනවා. එම වාර්තාව සභා සම්මත කිරීමට තීරණයක් ගන්නා මෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජී.මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, 2026.05.19 වන දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව සංශෝධන සහිතව සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්. ප්‍රියන්ත උපුල් කුමාර කරුණාරත්න මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජී.මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, මහ සභා රැස්වීම් වාර්තාවේ වෙනත් කරුණු යටතේ 37 වන පිටුවෙහි සඳහන් මා විසින් ඉදිරිපත් කර ඇති පහත සඳහන් අදහස් යටතේ,
"මම දේශපාලනික හොරකම් කරා නම් මට එදා තිබ්බානේ ටවුම කඩන්න නැතිව ඉන්න" යන ප්‍රකාශයෙහි, "මම දේශපාලනික කුහකකම් කරා නම්", ලෙස සංශෝධනය කළ යුතු බව දන්වා සිටිමි.

ඒ අනුව, 2026.05.19 දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**02.ගරු සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන - නැත**

**03. ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ පෙත්සම් පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම**

**3.1. නිවාඩු අනුමත කිරීම**

**ගරු සභාපති පී.ජී.අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීවරුනි, අද දින මහසභාවට සහ පහත සඳහන් කාරක සභා රැස්වීම්වලට සහභාගී නොවූ ගරු මන්ත්‍රීතුමන්ලාගේ සහ ගරු මන්ත්‍රීතුමියන්ලාගේ නිවාඩු අනුමත කිරීම සඳහා ඉදිරිපත් කරනවා.

**2026.06.16 දින මහ සභාව සඳහා නිවාඩු අනුමත කිරීම**

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී. කරුණාරත්න මැතිතුමා

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජී.මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, අද දින පැවති මහසභාවට සහභාගී නොවූ ඉහත සඳහන් ගරු මන්ත්‍රීතුමන්ගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එම්.ජී. චන්දිමා ලක්මාලි මල්ලව ආරච්චි මැතිනිය**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

**2026.06.02 - නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීම සඳහා නිවාඩු අනුමත කිරීම**

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජී. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ජී. නාරද සිරිවර්ධන මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.සී.පී. අතුකෝරාල මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්. සුසිල් ප්‍රේමසිංහ මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එම්. අකිල මධුජිත් කුමාර මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.චමින්ද මාල් මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී. කරුණාරත්න මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.පී. අජන්තා නීලකුමාරි මැතිනිය

**2026.06.02 - පරිසර හා පොදු පහසුකම් කාරක සභා රැස්වීම සඳහා නිවාඩු අනුමත කිරීම**

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද වර්ණසූරිය මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ජී. නාරද සිරිවර්ධන මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එම්. අකිල මධුජිත් කුමාර මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.චමින්ද මාල් මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. සිසිර කුමාර රාජපක්ෂ මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා

**2026.06.03 - කාර්මික සේවා කාරක සභා රැස්වීම සඳහා නිවාඩු අනුමත කිරීම**

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.පී. චන්ද්‍රසිරි මිගාර් පතිරණ මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. කරුණාරත්න මැතිතුමා

**2026.06.03 - මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම සඳහා නිවාඩු අනුමත කිරීම**

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්. සුසිල් ප්‍රේමසිංහ මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එම්. අකිල මධුජිත් කුමාර මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.පී. සිරිල් ජයවර්ධන මැතිතුමා

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්. ප්‍රියන්ත උපුල් කුමාර කරුණාරත්න මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඉහත දක්වා ඇති පරිදි කාරක සභා රැස්වීම්වලට සහභාගී නොවූ ඉහත සඳහන් ගරු මන්ත්‍රීතුමන්ලාගේ සහ ගරු මන්ත්‍රීතුමියගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එම්.ඒ. චන්දිමා ලක්මාලි මල්ලව ආරච්චි මැතිනිය**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, අද දින පැවති මහසභාවට සහ කාරක සභා රැස්වීම්වලට සහභාගී නොවූ ඉහත සඳහන් ගරු මන්ත්‍රීතුමන්ලාගේ සහ ගරු මන්ත්‍රීතුමිගේ නිවාඩු අනුමත කිරීම ඒකමතිකව සභා සම්මත විය.

**04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත**

**05. යථා පරිදි කල්දී ඇති යෝජනා**

**(05.1) ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන අංක 07/15/05/01 දරණ යෝජනාව**

අලව්ව ප්‍රාදේශීය සභාවේ සේවා ගිවිසුම් පදනම මත සේවය කරන පහත නම් සඳහන් රියදුරු, බරවාහන යන්ත්‍ර ක්‍රියාකරු හා සෞඛ්‍ය කම්කරු මහතුන්ගේ සේවා කාලය 2026.08.19 වන දිනෙන් අවසන් වන බැවින්, ඔවුන්ගේ සේවා කාලය 2026.08.20 සිට 2027.02.19 දක්වා මාස 06 කින් දීර්ඝ කිරීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

| අනු අංකය | නම | තනතුර | සේවා කාලය අවසන් වන දිනය | දීර්ඝ කිරීමට අවශ්‍ය කාලය |
|---|---|---|---|---|
| 01 | ඒ.ඩී.ජයාන් නිමේෂ් අලුත්ගේ මයා | රියදුරු | 2026.08.19 | 2026.08.20 සිට 2027.02.19 දක්වා |
| 02 | ආර්.එම්.බී.එන්. රාජපක්ෂ මයා | බර වාහන යන්ත්‍ර ක්‍රියාකරු | 2026.08.19 | 2026.08.20 සිට 2027.02.19 දක්වා |
| 03 | ඩබ්.නාමල් මධුශාන්ත විජේසිංහ මයා | රියදුරු | 2026.08.19 | 2026.08.20 සිට 2027.02.19 දක්වා |
| 04 | ආර්.ඒ.නුවන් ධනුෂ්ක රණසිංහ මයා | සෞඛ්‍ය කම්කරු | 2026.08.19 | 2026.08.20 සිට 2027.02.19 දක්වා |
| 05 | ඒ.ආර්.එරන්ද සජීව අතපත්තු මයා | සෞඛ්‍ය කම්කරු | 2026.08.19 | 2026.08.20 සිට 2027.02.19 දක්වා |
| 06 | පී.ඩී.සුමේධ කුමාරසිරි මයා | සෞඛ්‍ය කම්කරු | 2026.08.19 | 2026.08.20 සිට 2027.02.19 දක්වා |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.
ගරු සභාපතිතුමනි, ගැටලුවක් තියනවා. අපි මේකේ සෞඛ්‍ය කම්කරුවන් තුන් දෙනෙකුත් බඳවා ගෙන තියනවා.

ගිය සභා වාරයක ගරු මොහාන් මන්ත්‍රීතුමා ප්‍රකාශයක් කරා මාර්ග කම්කරුවන්ගෙන් සරෝජා විතරයි මාර්ග අතු ගාන්න ඉන්නේ කියලා. අපි බඳවා ගත්ත මේ සෞඛ්‍ය කම්කරුවන් තුන් දෙනා රාජකාරිය කරන්නේ මේ ස්ථානයේද?

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීතුමනි, නැහැ මේ සෞඛ්‍ය කම්කරුවන් තිදෙනාම කොම්පෝස්ට් අංගනයේ වැඩ කරන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඇත්තටම මේ ගැන නගරයේ ජීවත් වන ගරු මොහාන් මන්ත්‍රීතුමාලා කතා කරන්න ඕනි මම නෙවේ. තව මාර්ග, සෞඛ්‍ය කම්කරුවන් බඳවා ගෙන හරි අපිට තියන ගැටලු ටික විසඳ ගන්න ඕනි.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීවරුනි, අපි මේ මහසභාවේම බඳවා ගැනීම් සඳහා අනුමැතියක් දීලා තියනවා. දෙකක් අනුමත වෙලා ඇවිල්ලා තියනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, මේ ගන්න අය අදාල ස්ථානවලම ස්ථාන ගත කරේ නැත්නම් අපි කොච්චර අනුමැතිය ගන්න යොමු කරත් වැඩක් නැහැ. සෞඛ්‍ය කම්කරුවන් විදිහට අරන් මහත්තයෙක් වගේ ඉන්දවලා තිබ්බොත් මේ වැඩේ කරන්න බැහැ.මේ රටත්, ආණ්ඩුවත් අපි ඔක්කෝමත් බොහොම අමාරුවෙන් යන යුගයක්. ගම්වල සමහර අය පාරවල් අතු ගාන්න කැමති කියනවා. ඒ කෙනා ගන්න ඕනි.අද ගම්වල පාරවල් සුද්ද කර ගන්න බැහැ. ගම්මවල මිනිස්සු බනිනවා. ඒත් බැන්නට කට්ටිය නැහැනේ. ඒ නිසා මිනිස්සුන්ට ඒ වැඩ ගැන කියලා ඒකට කැමති අය අපි තව බඳවා ගන්න ඕනි. ඒකට අකමැති මිනිස්සු අරගෙන වෙන ස්ථානවල ස්ථාන ගත කළොත් මේ වැඩේ කරන්න බැහැ. ඒ නිසා විශේෂයෙන්ම ගරු සභාපතිතුමනි, මේ තනතුරුවලට බඳවා ගන්නකොට කැමති අය විතරක් බඳවා ගන්න කියලා මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ගරු සමන්ත යත්තල්ගොඩ මන්ත්‍රීතුමා කීවා වගේ නගරයේ ඉන්න මන්ත්‍රීවරයා මං. පැය 24 ම හම්බ වෙන්න ඉන්න මෙම්බර්වරයත් මම. අපේ නගරයේ ව්‍යාපාරිකයෝ විදිහට සියලුම දෙනා අහන එකක් තමා වරිපනම් බදු, කසල බදු ගෙවනවා සියල්ල කරනවා හැබැයි මාර්ගය පිරිසිදු කිරීම සඳහා කුණු ට්‍රැක්ටරයේ රියදුරු මහතා ඇතුළු අනිත් කට්ටිය එනවා, කලින් පාර අතු ගාන්න ගියේ හතර දෙනෙක් ප්‍රධාන මාර්ගවලට අමතරව අතුරු මාර්ගවලත් එක දවසේම කසල ඉවත් කිරීමේ ක්‍රමවේදයක් තිබ්බා. හැබයි අද ඒක නැහැ. එක් කෙනයි ඉන්නේ.ඒ නිසා පෙලක් පාරවල්වල සතියට දවස් දෙකක් විතරයි යන්නේ. මෙහෙම වෙද්දී නගරයේ, කොට්ඨාසයේ ඉන්න මන්ත්‍රීවරයා සහ වෙළඳ සංගමයේ හිටපු සභාපතිවරයා හැටියට අපේ අයිතිවාසකම් වෙනුවෙන් කතා කරන් නැත්තේ ඇයි කියලා අහනවා. අනිත් එක ඔබතුමා ප්‍රසිද්ධියේ රැස්වීම්වල කීවා "හිටපු සභාපතිවරු කරපු අපරාධය කරන් නැහැ, මේකේ කුණු අදින එක ගැන කියලා තමා ගන්නවා නම් ගන්නේ" කියලා කීවා. ඒවගේම මම 2006 දේශපාලනයට ආපු දවසේ ඉඳලා රස්සාවල් තියේද කියලා මගෙන් ඇහුවාහම පාරවල් අතු ගාන්න තියනවා, වැසිකිලි පද්ධතිය පිරිසිදු කරන්න තියනවා, කුණු ට්‍රැක්ටරයේ යන්න තියනවා ඒ කටයුතුවලට යන්න පුළුවන් කෙනෙක් ඉන්නවා නම් එන්න පුළුවන්, ඒ ටික කරන්න බැරි නම් ඡන්දය ඉල්ලලා මන්ත්‍රීකමකට හරි සභාපතිකම හරි කරන්න එන්න කියලා කීවා. එහෙම අපි ඇත්ත කියලා ගියේ නැත්නම්, මේ නගරයේ මිනිස්සු වරිපනම් බදු ගෙවනවා, වරිපනම් සීමා දීර්ඝ කරනවා, මේ එම සීමාව දීර්ඝ කරන්න තව මේ ප්‍රශ්න එනවා. මීට කලින් ලේකම්තුමියටත්, ඔබතුමාටත් මතක ඇති අපි කීවා අවශ්‍ය කරන මාර්ග සෞඛ්‍ය කම්කරුවන් ගන්න කියලා.ඒක අපි ඒකත්ඡන්දයෙන් සම්මත කළා. ඒ නිසා ඔබතුමා පැහැදිලිව නිරවුල්ව මේ කටයුත්ත කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, යම් යම් සාකච්ඡාවලදී මේ කියවෙන්නේ අපි හැමදාම කියපු දෙයක් සභාපතිවරයාට තියන බලය. මේකට කම්කරුවෙක්, සේවකයෙක් බඳවා ගන්න බලය තිබ්බේ සභාපතිවරයාට. ඒක දැන් නීති රීති, රෙගුලාසි යම් යම් කාල පරාසවල ඉහළින් ඇවිල්ලා ඒවා අපෙන් උදුරාගෙන තියනවා. ඕවාට විරුද්ධව අපි එදත් කතා කරා. සභාපතිතුමාට බලය තිබ්බා නම්,

අද මේ මාතෘකාව ඉදිරිපත් වෙන් නැහැ. එහෙම නම් අද කැඳවලා, හෙට දිහාට කොන්ත්‍රාත් පදනම යටතේ බඳවා ගන්නවා. හැබැයි අපි සභාපතිතුමාටත්, ලේකම්තුමියටත් කතා කරලා බඳවා ගැනීම සඳහා මහසභාවේ තීන්දුවක් ගන්න කියලා කීවා.

ඊට උඩින් එකක් නැහැ කොන්ත්‍රාත් පදනම යටතේ හරි බඳවා ගෙන ඊට පස්සේ කාඩර් එක ඇතුළට එනකොට ඉතිරි ටික කරමු කියලා කීවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, මම දැනුත් කියන්නේ මේ අර්බුදය තවත් ඉදිරියට වැඩි වෙන්න කලින් මේ බඳවා ගැනීම් කරන්න. අනිත් එක මෙතනදී හොඳ අදහසක් ආවා. අපි කම්කරුවන් ගන්නවා නම්,

ඒ පිළිබඳව දැනුවත් කරලා බඳවා ගන්න ඕනි කියලා. නගරයේ සුද්ද කිරීම ගැන ඇත්තටම ප්‍රශ්නයක් තියනවා. කුණු ට්‍රැක්ටරය කුණු ටික ගන් නැත්නම් ඒක ලොකු ප්‍රශ්නයක්. මතකද හිටපු ගරු සභාපති සන්ධ්‍යා කුමාර මැතිතුමා ඉන්න කාලයේ නගරයේ දවස් දෙකක් කුණු ගන් නැතුව හිටියා, තව එක දවසක් ගන්න බැරි වුණා නම් ප්‍රාදේශීය සභාව පෙරලනවා. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීතුමන්ලාට උනත් හදිස්සියේ ප්‍රභූ කෙනෙක් නැති වෙලා පාර එළි කරලා දෙන්න කීවොත් ඒකට දාන්න කණ්ඩායමක් නැහැ. එතකොට අසරණ වෙනවා. ඒ නිසා කුණු ප්‍රශ්නය කියන එක ලේසි පහසු දෙයක් නෙවේ. දවස් දෙකක් මේක කරන්න බැරි වුණොත් එන විරෝධතා කොච්චරද කියලා හිතා ගන්න බැහැ.ඒ නිසා ගරු සභාපතිතුමනි, ඉතා කඩිනමින් බඳවා ගැනීම් ටික කරන්න කියන කාරණය මතක් කරනවා.

ඒ අනුව, අලව්ව ප්‍රාදේශීය සභාවේ සේවා ගිවිසුම් පදනම මත සේවය කරන ඉහත නම් සඳහන් රියදුරු, බරවාහන යන්ත්‍ර ක්‍රියාකරු හා සෞඛ්‍ය කම්කරු මහතුන්ගේ සේවා කාලය 2026.08.19 වන දිනෙන් අවසන් වන බැවින්, ඔවුන්ගේ සේවා කාලය 2026.08.20 සිට 2027.02.19 දක්වා මාස 06 කින් දීර්ඝ කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05.2)** **<u>ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව අංක 07/15/05/02 දරණ යෝජනාව</u>**

අලව්ව ප්‍රාදේශීය සභාවේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ජේ.එච්.එම්.එල්.එස්. ජයසුන්දර මැතිනිය විසින් 2026.06.03 දින ලිපියෙන් පහත සඳහන් කමිටු සඳහා ඇතුළත් කර ගන්නා ලෙස ඉල්ලීමක් කර ඇත. ඒ අනුව, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ජේ.එච්.එම්.එල්.එස්. ජයසුන්දර මැතිනිය පහත සඳහන් කමිටු සඳහා සාමාජිකාවක් ලෙස පත් කිරීම සුදුසු බවට යෝජනා කරමි.

(I) කාර්මික සේවා කාරක සභාව
(II) පරිසර හා පොදු පහසුකම් කාරක සභාව
(III) නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාව

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජේ. චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, අලව්ව ප්‍රාදේශීය සභාවේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ජේ.එච්.එම්.එල්.එස්. ජයසුන්දර මැතිනිය ඉහත සඳහන් කමිටු සඳහා සාමාජිකාවක් ලෙස පත් කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05.3)** **<u>ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව අංක 07/15/05/03 දරණ යෝජනාව</u>**

අලව්ව ප්‍රාදේශීය සභාවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පණතේ 11 (i) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති විසින් එවන ලද අංක NWPLG/KR/B/APS/05/2025/44හා 2026.05.28 දිනැතිව එවන ලද විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාවේ තත්ත්වාගණනය කළ පහත සඳහන් මතය මහ සභාවට ඉදිරිපත් කරන අතර එය පිළිගැනීම සුදුසු බවට යෝජනා කරමි.

“ මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2025 දෙසැම්බර් 31 දිනට අලව්ව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ. ”

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජේ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, අලව්ව ප්‍රාදේශීය සභාවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පණතේ 11 (i) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති විසින් එවන ලද අංක NWPLG/KR/B/APS/05/2025/44හා 2026.05.28 දිනැතිව එවන ලද විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාවේ තත්ත්වාගණනය කළ ඉහත සඳහන් මතය පිළිගැනීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**(05.4)** **<u>ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් 2026.06.03 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවෙන් කරනු ලබන අංක 07/15/05/04 දරණ යෝජනාව</u>**

අලව්ව පොදු වෙළඳපොල ඌරු මස් කඩය හා කුකුල් මස් කඩය වසර තුනක් සඳහා වසරකට 10% බැගින් වැඩිවීමේ පදනම මත ගිවිසුම් ගත වී ඇති වත්කම් දෙකක් බැවින් හා බදුකරු වත්කම අළුත්වැඩියා කර ඇති බැවින් එම වසර 03 අවසන් වනතෙක් එම ගිවිසුම ම පවත්වාගෙන යාම සුදුසු බවටත්, නව තක්සේරුවට අදාලව ගිවිසුම් සංශෝධනය නොකිරීම සුදුසු බවටත් 2026.06.03 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ තීරණ අංක 03 මගින් නිර්දේශ කරන ලදී. ඒ අනුව, අලව්ව පොදු වෙළඳපොල ඌරු මස් කඩය හා කුකුල් මස් කඩය ගිවිසුම් ගත වූ වසර 03 අවසන් වන තෙක් එම ගිවිසුම ම පවත්වාගෙන යාම සුදුසු බවටත්, නව තක්සේරුවට අදාලව ගිවිසුම් සංශෝධනය නොකිරීම සුදුසු බවටත් යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජ්. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, අලව්ව පොදු වෙළඳපොල ඌරු මස් කඩය හා කුකුල් මස් කඩය ගිවිසුම් ගත වූ වසර 03 අවසන් වනතෙක් එම ගිවිසුම ම පවත්වාගෙන යාම සුදුසු බවටත්, නව තක්සේරුවට අදාලව ගිවිසුම් සංශෝධනය නොකිරීම සුදුසු බවටත් ඒකමතිකව සහා සම්මත විය.

**(05.5)** **<u>ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව අංක 07/15/05/05 දරණ යෝජනාව</u>**

අලව්ව ප්‍රාදේශීය සභාවට අයත් වත්කම් ප්‍රසිද්ධ ටෙන්ඩර් කැඳවා බදු ලබා දීමට අදාලව ටෙන්ඩර් ලේඛනයේ සඳහන් වත්කම් 32 (අලව්ව ප්‍රධාන කාර්යාලයේ වත්කම් 22, කැප්පිටවලාන උප කාර්යාලයේ වත්කම් 07, මහරච්චිමුල්ල උප කාර්යාලයේ වත්කම් 03) 2027.01.01 දින සිට 2027.12.31 දින දක්වා කාලයට අදාලව බදු දීම සඳහා ටෙන්ඩර් කැඳවීමට අවශ්‍ය නිර්දේශය මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ තීරණ අංක 05 මගින් ලැබී ඇති අතර, ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභාවට අයත් වත්කම් ප්‍රසිද්ධ ටෙන්ඩර් කැඳවා, බදු ලබා දීමට අදාලව පහත ටෙන්ඩර් ලේඛනයෙහි සඳහන් වත්කම් ටෙන්ඩර් කිරීම සුදුසු බවට යෝජනා කරමි.

| අනු අංකය | වත්කම | **2026** අවම ලංසුව (රු. ශත) | **2026** වර්ෂයේ බදු ලබා දුන් මුදල (රු. ශත) | වෙනත් කරුණු | **2027** අවම ලංසුව (රු. ශත) |
|---|---|---|---|---|---|
| 01 | අලව්ව සතිපොල | 6600000.00 | | 2027 වර්ෂය සඳහා ටෙන්ඩර් නොකර ප්‍රාදේශිය සභාවේ සේවක මහතුන් යොදවා සිදු කිරීමට නිර්දේශ කරන ලදී. | |
| 02 | අලව්ව සතිපොල ආපනශාලාව | 152460.00 | 152500.00 | 2026 වර්ෂයේ අවම ලංසු මුදලට 10%ක් එකතුකර 2027 වර්ෂය සඳහා ටෙන්ඩර් ලබා දීමට නිර්දේශ කරන ලදී. | 167706.00 |
| 03 | අලව්ව සතිපොල පොදු වැසිකිලිය | 28600.00 | 50000.00 | | 31460.00 |
| 04 | අලව්ව සතිපොල මස්/මාළු කඩ 01 | 90750.00 | 91000.00 | | 99825.00 |
| 05 | අලව්ව සතිපොල මස්/මාළු කඩ 02 | 82500.00 | 99000.00 | | 90750.00 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 06 | අලව්ව සතිපොල මස්/මාළු කඩ 03 | 82500.00 | 100000.00 | 2026 වර්ෂයේ බදු නොගිය වත්කම් බැවින් 10% වැඩි නොකර 2026 අවම ලංසු මුදලටම ලබා දීමට නිර්දේශ කරන ලදී. | 82500.00 |
| 07 | අලව්ව සතිපොල මස්/මාළු කඩ 04 | 82500.00 | | | 82500.00 |
| 08 | අලව්ව සතිපොල මස්/මාළු කඩ 05 | 90750.00 | | | 90750.00 |
| 09 | අලව්ව සතිපොල මස්/මාළු කඩ 06 | 90750.00 | | | 90750.00 |
| 10 | අලව්ව සතිපොල මස්/මාළු කඩ 07 | 82500.00 | | | 82500.00 |
| 11 | අලව්ව සතිපොල මස්/මාළු කඩ 08 | 82500.00 | | | 82500.00 |
| 12 | අලව්ව සතිපොල මස්/මාළු කඩ 09 | 82500.00 | | | 82500.00 |
| 13 | අලව්ව සතිපොල මස්/මාළු කඩ 10 | 82500.00 | | | 82500.00 |
| 14 | අලව්ව පොදු වෙළඳපොල එළු මස් කඩය | 228000.00 | 30650.00 | 2026 වර්ෂයේ ලබා දුන් අවම ලංසු මුදලට 10%ක් එකතුකර 2027 වර්ෂය සඳහා ටෙන්ඩර් ලබා දීමට නිර්දේශ කරන ලදී.. | 33674.00 |
| 15 | අලව්ව පොදු වෙළඳපොල එළහරක් මස් කඩය | 1331000.00 | 1332000.00 | 2026.05.06 දිනැති නව තක්සේරු වාර්තාව අනුව එම අවම ලංසු මුදලට ටෙන්ඩර් කිරීමට නිර්දේශ කරන ලදී. | 1450000.00 |
| 16 | අලව්ව බස් නැවතුම්පල පොදු වැසිකිලිය | 108900.00 | 109000.00 | 2026 වර්ෂයේ අවම ලංසු මුදලට 10%ක් එකතුකර 2027 වර්ෂය සඳහා ටෙන්ඩර් ලබා දීමට නිර්දේශ කරන ලදී. | 119790.00 |
| 17 | අලව්ව දුම්රියපොල පොදු වැසිකිලිය | 65340.00 | 65450.00 | | 71874.00 |
| 18 | අලව්ව නගරයේ මාළු කඩ අංක 01 | 145200.00 | 298500.00 | | 159720.00 |
| 19 | අලව්ව නගරයේ මාළු කඩ අංක 02 | 145200.00 | 146000.00 | | 159720.00 |
| 20 | අලව්ව නගරයේ මාළු කඩ අංක 03 | 121000.00 | 121500.00 | | 133100.00 |
| 21 | අලව්ව නගරයේ මාළු කඩ අංක 04 | 121000.00 | 299600.00 | | 133100.00 |
| 22 | ගල්වාරම සැනසුම පියස සහා ඉඩමේ පොල් එලදාව | 2904.00 | 2920.00 | 2026 වර්ෂයේ අවම ලංසු මුදලට 10%ක් එකතුකර 2027 වර්ෂය සඳහා ටෙන්ඩර් ලබා දීමට නිර්දේශ කරන ලදී. | 3194.00 |

කැප්පිටිවලාන උප කාර්යාලය

| අනු අංකය | වත්කම | 2026 අවම ලංසුව (රු. ශත) | 2026 වර්ෂයේ බදු ලබා දුන් මුදල (රු. ශත) | වෙනත් කරුණු | 2027 අවම ලංසුව (රු. ශත) |
|---|---|---|---|---|---|
| 01 | බෝයවලාන සතිපොල භූමියේ මාළු ලැල්ල | 34303.50 | 34500.00 | 2026 වර්ෂයේ අවම ලංසු මුදලට 10%ක් එකතුකර 2027 වර්ෂය සඳහා ටෙන්ඩර් ලබා දීමට නිර්දේශ කරන ලදි. | 37733.85 |
| 02 | මොරටුු කන්ද සුසාන භූමියේ පොල් ඵලදාව | 26741.00 | 32000.00 | | 29415.00 |
| 03 | ඉඹුල්ගොඩ ගල්කඩුල්ල හේන කැබලි අංක 01 | 2420.00 | 2500.00 | | 2662.00 |
| 04 | බෝයවලාන නගරයේ කුකුල් මස් කඩය | 26620.00 | 27500.00 | | 29282.00 |
| 05 | බෝයවලාන නගරයේ ඌරු මස් කඩය | 11275.00 | | ටෙන්ඩර් ලේඛනයෙන් ඉවත් කිරීමට නිර්දේශ කරන ලදි. | 11275.00 |
| 06 | මිල්ලගහවත්ත ඉඩමේ සභාව සතු කොටස බදු දිම | 1210.00 | 1100.00 | 2026 වර්ෂයේ අවම ලංසු මුදලට 10%ක් එකතුකර 2027 වර්ෂය සඳහා ටෙන්ඩර් ලබා දීමට නිර්දේශ කරන ලදි. | 1331.00 |
| 07 | කැප්පිටිවලාන සුසාන භූමියේ පොල් ඵලදාව | 3300.00 | 3500.00 | | 3630.00 |

මහරච්චිමුල්ල උප කාර්යාලය

| අනු අංකය | වත්කම | 2026 අවම ලංසුව (රු. ශත) | 2026 වර්ෂයේ බදු ලබා දුන් මුදල (රු. ශත) | වෙනත් කරුණු | 2027 අවම ලංසුව (රු. ශත) |
|---|---|---|---|---|---|
| 01 | මහරච්චිමුල්ල විල්ගමුව එස්ටේට් වෙන්දේසි ඉඩමේ සභාව සතු කොටස | 2420.00 | 2600.00 | 2026 වර්ෂයේ අවම ලංසු මුදලට 10%ක් එකතුකර 2027 වර්ෂය සඳහා ටෙන්ඩර් ලබා දීමට නිර්දේශ කරන ලදි. | 2662.00 |
| 02 | මහරච්චිමුල්ල උප කාර්යාල භූමියේ පොල් ඵලදාව | 1210.00 | 3150.00 | | 1331.00 |
| 03 | හිත්තරපොල කොහොල්ලැපිටිය සභාව සතු ඉඩමේ පොල් ඵලදාව | 6655.00 | 6000.00 | | 7320.50 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, අලව්ව ප්‍රාදේශීය සභාවට අයත් වත්කම් ප්‍රසිද්ධ ටෙන්ඩර් කැඳවා, බදු ලබා දීමට අදාලව ඉහත ටෙන්ඩර් ලේඛනයෙහි සඳහන් වත්කම් ටෙන්ඩර් කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**(05.6)** <u>**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් 2026.06.03 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවෙන් ඉදිරිපත් කරනු ලබන අංක 07/15/05/06 දරණ යෝජනාව**</u>

බෝයවලාන නගරයේ පෞද්ගලික ස්ථානයක පවත්වාගෙන ගිය ඌරු මස් කඩය 2024 වර්ෂය සඳහා ටෙන්ඩර් ගිය නමුත් අලව්ව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය මඟින් බලපත්‍ර රහිතව මස් අලෙවි කිරීම හේතුවෙන් තහනම් කිරීමට ලක් කර ඇති අතර, එම වර්ෂයෙන් පසුව මෙම දේපල ටෙන්ඩර ලබා ගැනීමට කිසිදු කෙනෙකු ඉදිරිපත් වී නොමැති බැවින්, මෙම කඩ කාමරය පෞද්ගලික ස්ථානයක පවත්වාගෙන යාම සහ එය සභාව සතු දේපලක් නොවන නිසාත්,ඒ අනුව 2024 වර්ෂයේ සිට ටෙන්ඩර් නොගිය දේපලක් නිසාත් ලේඛනයෙන් ඉවත් කිරීම සඳහා 2026.06.03 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ තීරණ අංකය 05 මඟින් නිර්දේශ වී ඇත. ඒ අනුව, බෝයවලාන නගරයේ ඌරු මස් කඩය පෞද්ගලික ස්ථානයක පවත්වාගෙන යන නිසාත්, සභාව සතු දේපලක් නොවන නිසාත් 2024 වර්ෂයේ සිට ටෙන්ඩර් නොගිය දේපලක් නිසාත් ටෙන්ඩර් ලේඛනයෙන් ඉවත් කිරීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. නාරද සිරිවර්ධන මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා
ගරු සභාපතිතුමනි, මන් හිතන්නේ බෝයවලාන නගරයේ කුකුල් මස් කඩත් රාශියක් තියනවා. ඔතන අපේ කුකුල් මස් කඩෙත් තියනවානේ ඒකටත් මොකක් හරි ක්‍රමවේදයක් ගන්න ඕනි. ඕවා එක එක්කෙනා තරගයට ඉල්ලලා බොහෝම ඉහළ ලංසු වලට තමා ගිහින් තියෙන්නේ. හැබැයි හිටපු ගරු සන්ධ්‍යා කුමාර සභාපතිතුමා ලොකු වැරැද්දක් කරා. බෝයවලාන නගරයේ කුකුල් මස් කඩය හොඳට කරගෙන ආවා. ඒක අරගෙන ලාභයක් තියෙන්න ඕනිනේ. ලක්ෂ ගණන්වලට ඕක අරගෙන වෙළඳාමක් තියෙන්න එපැයි. එතන පෙර හිටපු මුස්ලිම් මනුස්සයාගේ ඥාතියෙක් ඇවිල්ලා එයාගේ ඉඩමේ පොඩි කඩ කැල්ලක් හදාගෙන කුකුල් මස් කඩයක් දාලා බලපත්‍රය ගැනීම සඳහා සභාවේ අනුමැතියට දැම්මා. හැබැයි අපි ඒකට විරුද්ධ වුණා. එතකොට අපේ සභාවට එන්නේ රු.1500.00 ක වගේ වෙළඳ බලපත්‍ර ගාස්තුව විතරයි. ටෙන්ඩර් දාලා නෙවේනේ යන්නේ. සභාවේ වෙළඳ බලපත්‍රය විතරක් ගන්න එනවා. එදා ලොකු පාඩුවක් සභාවට වුණා. අද මන් හිතන්නේ ඒ කුකුල් මස් කඩය ඉතාමත් සාර්ථකව කරගෙන යනවා. හැබැයි එදා සභාවට ආදායමක් තමා නැතිව ගියේ. මන් හිතන් නැහැ අද සභාවට බෝයවලානේ කුකුල් මස් කඩයක් දාන්න හම්බ වෙයි කියලා. මොකද අතෙන්ට තමා මිනිස්සු හුරු වෙලා ඉන්නේ. ඒ නිසා ඒකට මොකක් හරි ක්‍රමවේදයක් ගන්න කියලා තමා මම මේ අවස්ථාවේ කියන්නේ.

ඒ අනුව, බෝයවලාන නගරයේ ඌරු මස් කඩය පෞද්ගලික ස්ථානයක පවත්වාගෙන යන නිසාත්, සභාව සතු දේපලක් නොවන නිසාත් 2024 වර්ෂයේ සිට ටෙන්ඩර් නොගිය දේපලක් නිසාත් ටෙන්ඩර් ලේඛනයෙන් ඉවත් කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05.7)** <u>**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන අංක 07/15/05/07 දරණ යෝජනාව**</u>

අලව්ව ප්‍රාදේශීය සභාවට අයත් දවටගොල්ල සුසාන භූමිය පිහිටි ඉඩමේ ඉදිකිරීමට යෝජිතව ඇති නව ආදාහනාගාරය සඳහා දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් ලබා ගැනීමට නියමිත රු.මිලියන 20 ක ණය මුදල මාසික වාරික 120 කින් ගෙවීමටත්, යම් හෙයකින් එම මුදල ගෙවීමට අපහසුතාවයක් ඇති වුවහොත් එම මුදල සභාවට අයවිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තුවලින් අය කර ගැනීමට පළාත් පාලන කොමසාරිස්ට බලය පැවරීම සුදුසු බවටද යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එච්. සදෙව් ලක්ජය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඔබතුමාට කියන්න එක දෙයක් තියනවා. මේකේදී මිලියන 20 ක ණයක් ගන්නවා එතකොට මාසික වාරිකයක් අඩුම ලක්ෂ 03කින් එහා විතර වෙයි. එතකොට මේ වෙලාවේ ගරු සභාපතිතුමා මම දකින දේ සහ මගේ පුද්ගලික මතය මේක ඔබතුමා විෂය භාර අමාත්‍යවරයාට කතා කරලා ගරු ජනාධිපතිතුමාට කතා කරන්න. විශේෂයෙන්ම අපි හුඟාක් වෙලාවට ගණුදෙනු කරන්නේ නාගරික සංවර්ධන අධිකාරියත් එක්කයි. නාගරික සංවර්ධන අධිකාරියේ වත්මන් අමාත්‍යවරයා තමා ගරු බිමල් රත්නායන මැතිතුමා. ඔබ තුමාලත් එක්ක ළඟ ක්‍රියාකාරී දේශපාලනයේ හිටපු අය. බල්ක් එකක් විදහට ඉතිරි වුණ සල්ලි UDA එකේ තියනවා. ඒ නිසා ඔබතුමා ඉල්ලීමක් කරන්න. පැති බැමි බදින්න අනිත් කට්ටියගේ ගිණුම්වලට ලක්ෂ 50 ,60 මුදල් එනවා නම් මේ කෝටි දෙකක මුදලකට අපි ණයක් වෙන්න යනවා. මේකේදී බරපතලම කාරණයක් තියනවා ගරු සභාපතිතුමා. අවබෝධයක් තියන අය ඒක පැහැදිලි කරයි.

මේ සභාවේ පළාත් පාලන පනත හදපු දවසේ ඉදලා මේ සභාවට තිබ්බ බලය එකින් එක උදුර ගන්නකොට ඒකට විරුද්ධව කතා කරපු දෙන්නෙක් තමා චමින්ද වර්ණසූරිය මන්ත්‍රීතුමයි මායි.ගරු සභාපතිතුමා,මෙම යෝජනාවට අනුව අපි යම්කිසි හිර වීමකට ලක් නොවේ යැයි කියන්න බැහැ. මෙතන "එම මුදල ගෙවීමට අපහසුතාවයක් ඇතිවුවහොත් එම මුදල සභාවට අයවිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තුවලින් අය කර ගැනීමට පළාත් පාලන කොමසාරිස්ට බලය පැවරීම සුදුසු බවට යෝජනා කරමි"කියලා සඳහන් වෙනවා. මෙන්න මෙතන තමයි ගැටළුව. අපේ සභාවේ ඔබතුමා විධායකය, සභාපතිතුමා ඊළඟට ලේකම්තුමිය, පරිපාලනය කියන එක හිර වීමක් වුණොත් ඒ හිරවීමට සමස්තයක් වශයෙන් අපි සියලු දෙනාම වගකියන්න ඕනි.

ඒ නිසා ගරු අශෝක ගුණසේන මැතිතුමා සමඟ ඔබතුමාලාට කතා කරන්න බැරි නම් අපි කණ්ඩායම කතා කරලා කියන්නම් බල්ක් එකක් හැටියට පැති බැම්වලට ලක්ෂ 50, 50 එනකොට ඒවායෙන් හතරක් විතර දාන්න, අපේ මන්ත්‍රීවරුන්ට වෙන් කරන මුදල් ටික තියෙන්නේ ඒකත් ඕනි නම් මේකට එකතු කරන්න කියලා. මේකට ඔබතුමා යන්න එපා. මේකේදී හිර වීමක් ආවොත් ඔබයි අපියි මුළු සභාවම හිර වෙනවා.

ඔබතුමා බිමල් රත්නායක මැතිතුමාට කතා කරන්න. පක්ෂ විපක්ෂ අපි සියලු දෙනා ඒකත්ඡන්දයෙන් සභාවේ යෝජනාවක් සම්මත කරමු. නාගරික සංවර්ධන අධිකාරියේ මුදල් තියේ නම්, ඒ මුදල්වලින් අපිට ලක්ෂ 500 දෙන්න කියන්න.එහෙම නැත්නම් ගරු ජනාධිපතිතුමාත් එක්ක කතා කරලා ඔබතුමා කියන්න "කරුණාකරලා මේකට මුදලක් දෙන්න මාව ණය කාරයෙක් කරන්න එපා" කියලා. සභාව ණයකාරයෙක් නොකර යන එක ගරු මන්ත්‍රී මණ්ඩලය හැටියට අපේ වගකීමක්. ඒ නිසා අපිට යන්න පුළුවන් සීමාවල් තියනවා.ගරු සභාපතිතුමනි, අපි ආදාහනාගාරයක් හදලා ඉවර කරනකොට ඒ ආදාහනාගාරය හදන්න ගිය ලක්ෂ 500ට අමතරව, අපි ඒකට සේවක මහත්වරුන් තුන් දෙනෙක් යොදන්න ඕනි, ඒකට අවශ්‍ය ගෑස් පද්ධතිය දෛනිකව ලබා දෙන්න ඕනි. ඊළඟට මේක සහන සේවාවක් හැටියට හැම සභාවම කරන්නේ.අපි කරන්නේ ඒකේ ලාභාංශයක් තියාගෙන නෙවේ. එතකොට මේ සියල්ල ගණනය කරලා අවසානය වෙනකොට ගත්ත ණයට මාසෙකට ලක්ෂ 03 ක විතර වාරිකයක් එනකොට මේ එන ආදායමෙන් ගෙවන්න පුළුවන්ද බැරිද කියලා මම දන්නේ නැහැ. ඒ නිසා ගරු සභාපතිතුමනි,මේක ගැන තුන් පාරක් හිතලා කටයුතු කරන්න කියන ඉල්ලීම මම කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම අපේ ප්‍රාදේශිය සභාව ලොකු ආර්ථික පසුබිමක් තියන ප්‍රාදේශීය සභාවක් නෙවේ. ඒ හින්දා මේ යෝජනාවට අපිට කිසිසේත්ම එකඟ වෙන්න බැහැ. මේ ලෝන් ඒක ගත්තාහම ලක්ෂ දෙකයි තුනයි අතර වාරිකයක් ගෙවන්න සිදු වෙනවා කියලා අපි උපකල්පනය කරනවා. අපි පහුගිය කාලය ගත්තාහම මේ රට ඉතාම අසීරු යුගයක ඉද්දී රනිල් වික්‍රමසිංහ හිටපු ගරු ජනාධිපතිතුමා අවුරුදු දෙකක් ඇතුළත ඩොලර් බිලියන 6.6 ක ආර්ථිකයක් හැදුවා. ගරු අනුර කුමාර ජනාධිපතිතුමා රට භාර ගන්නකොට 6.6 ට එකවුන්ට් එක තිබ්බා. දැන් බිලයන 6.8 ට තියෙන්නේ.අවුරුද්දයි මාස හයක් ගෙවිලා තියනවා. එතකොට ගරු ජනාධිපතිතුමා රටට ඩොලර් එපා කීවේ නැහැනේ. මේ රට යන්නේ අවිනිශ්චිත ආර්ථිකයක් සමඟයි. අපිට මේ ආදායම රටට එයිද ප්‍රාදේශීය සභාවට එයිද කියලා පුරෝකථනය කරන්න බැහැ. ඒ හින්දා මේක කළොත් මේක ඉතාම මෝඩ තීන්දුවක් වෙන්නේ. ඒ නිසා දශම දෙකයි අපේ ආර්ථිකය වැඩි වෙලා තියෙන්නේ. ලෝකේ ප්‍රවණතාවය, රටේ ප්‍රවණතාවය එක්කේ දේවල් හේතු කරගෙන රට වැටෙනවා.

වැටුපෙන් 20%කුත් අපිට ගෙවන්න කියලා ඇවිල්ලා තිබ්බා. ඒක නිසා අපි බොහොම දුප්පත් ප්‍රාදේශීය සභාවක්. ආයේ දැවැන්ත වැස්සක් ඇවිත් පාරවල් කැඩිලා යයිද, ලොකුවට හානි වෙලා වතුර නැතිව අපේ මිනිස්සුන්ට වතුර ටික දෙන්න වෙයිද, ආහාර නැති වුණොත් කන්න වියළි සලාක දෙන්න වෙයි ද අපි දන් නැහැ. අපි පුංචි ප්‍රාදේශීය සභාවක් නිසා අපිට තියන ආර්ථික ශක්තිය අනුව අපි වැඩ කරන්න ඕනි. අපි මේ තීන්දුව ගත්තොත් අපි මන්ත්‍රීවරු විදිහට ගත්ත ඉතාම නුගත් තීන්දුවක් හැටියට මම නම් පුද්ගලිකව හිතන්නේ. ගරු අශෝක මැතිතුමාට පුළුවන් ගරු ජනාධිපතිතුමාට කතා කරලා පාර්ලිමේන්තු කණ්ඩායම් රැස්වීමේදී කතා කරලා මේ ව්‍යාපෘතිය අපි 26 දෙනාගේම ව්‍යාපෘතියක් හැටියට ඉදිරිපත් කරන්න. මොකද අපිට මේක කරන්න ඕනි. පක්ෂ පාට භේදයකින් තොරව අලව්වට අවශ්‍ය දෙයක්. ඉතිහාසයේ ඉඳන් මම දන්න හැටියට නම් අලව්ව සභාව ණය අරන් නැහැ. අලව්ව නාරම්මල දෙක එකට තියනකොට අරන් තියනවා. එතකොට ඇතෙක් වගේ ආදායම තිබ්බානේ. දැන් පුංචි සභාවක් ආදායම් අඩුයි. මගේ යෝජනාව නම් ගරු මන්ත්‍රීවරු සියලු දෙනා එකතු වෙලා තීන්දුවක් ගමු. අනාගතයේ ඔයාලටවත් පාරක් හදාගන්න බැරි වෙයි සල්ලි නැති වෙලා. මේවා ගෙවන්න ගියහම මුද්දර සල්ලි අඩු වෙන්න පුළුවන්. අපිට ආදායම් පුරෝකථන හරියටම කරන්න බැහැනේ. ඒනිසා අපි කවුරුත් එකතු වෙලා 26 දෙනාම ඒකමතිකව තීන්දුවක් ගමු. ඔබතුමන්ලාට පුළුවන් නම් ගරු ජනාධිපතිතුමාට, කැබිනට් එකට කතා කරලා, පාර්ලිමේන්තු මන්ත්‍රීතුමත් සම්බන්ධ කරගෙන මේ වැඩේ කරන්න. සභාවේ සල්ලි අරන් කරන්න ගියොත් අපේ බදු ගෙවන අපේ ආදරණීය ජනතාවට කරන අසාධාරණයක්.මොකද ඒ මිනිස්සුන්ට වීථි ලාම්පු කැඩුණාම හදලා දෙන්න ඕනි. පාර කැඩුණාම හදලා දෙන්න ඕනි. ගැබිණි මව්වරුන්ට උදව් කරන්න ඕනි, සභාවෙන් කරන සේවාවන්වලට මේක බලපානවා. අපි කෝටිපති සභාවක් නෙවේනේ. ආර්ථික මට්ටම අඩු සභාවක්.ඒ නිසා මම යෝජනා කරන්නේ අනිවාර්යෙන් මේ මතයට කවුරුත් එකඟ වෙනන එපා. මොකද බොහොම අමාරුවෙන් අපි ස්ථාවරයක් දාගෙන තියනවා අපිට ප්‍රධාන ගොඩනැගිල්ලක් නැහැ. ගරු සභාපතිතුමා සභා ගොඩනැගිල්ලට,ආදාහනාගාරයට මුදල් ගේනවා කියලා කීවා මට මතකයි. මේකට ණයක් අරන් කරන්න ගියොත් අපි ඔක්කෝම අමාරුවේ වැටෙනවා ඒ නිසා හැමෝගේම ඒකමතික තීරණයකට සුදුසු තීන්දුවක් ගන්න කියලා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. නාරද සිරිවර්ධන මැතිතුමා**

ගරු සභාපතිතුමනි, ඔබතුමා අපිත් එක්ක සාකච්ඡා කරලා, දන්න අයත් එක්ක සාකච්ඡා කරලා මේක කොහොමද කරන්න පුළුවන් කියලා බලලා ගන්න තීන්දුව ඔබතුමාගේ විය යුතුයි. දැන් අපි ආදාහනාගාරයක් හදන්න යෝජනා කරලා තියෙන්නේ. මුල් සභාවල හුම්බුළුව අපි යෝජනා කරේ. බොහොම හොඳ තැනක්. මඩවල අක්කර දෙකක වගේ භූමියක් තියනවා. ගෙවල් දොරවල් නැහැ. හැබැයි මේ හැමදෙයක්ම නගරයෙන් ඈතට ගන්න ගිහාම එතනත් ප්‍රශ්නයක් මන් හිතන්නේ තියනවා. මොකද මිනිස්සු මේවාගෙන් වෙන හානි බලන්නේ. ප්‍රදේශයට දුම් පිටවෙනකොට, නාගරික ප්‍රදේශයක ඉදි වෙනකොට, ජනගහනය වැඩි තැනක තියනකොට මන් හිතන්නේ ප්‍රශ්න ඇති වෙනවා. ඉස්සල්ලාම තීන්දුව ගත්තේ ණයක් අරන් හදන්න නෙවේනේ. එතකොට ඒකේදී යම් මුදලක් ණයට අරගෙන කොටසක් අතින් දාලා කරනවා කියලා කීවා. ඒත් දැන් සම්පූර්ණ මුදල ණයට ගන්න තත්ත්වයට පත් වෙලා තියනවා. භාණ්ඩාගාරය පිරී ඉතිරී යනවා නම්, ඒ තියන සල්ලිවලින් සල්ලි ටිකක් ඉල්ල ගන්න. දැන් බදු වැඩි කරලා තියනවා හැමදේකින්ම අද වරිපනම් වැඩි කරලා මොනවා හරි අපහසුතා එනකොට ඒක ජනතාව පිට පටවනවා. නමුත් ජනතාව බලාපොරොත්තු වෙන්නේ සහන.ජනතාව ඔබතුමන්ලාට ඡන්දය දුන්නේ ඒ ජනතාවගේ ඒ අවශ්‍යතා,පොදු පහසුකම් ඒ ටික ඔබතුමන්ලා සපුරයි කියලා විශ්වාසය ඇතිවයි. එතකොට ඔබතුමන්ලා ආදාහනාගාරය සඳහා සම්පූර්ණ ණය මුදලක් අරගෙන ගෙවන්න බැරි වෙනකොට ප්‍රදේශයේ ජනතාවට තමා ඒ බරත් දරන්න සිද්ධ වෙන්නේ. ඒ නිසා සම්පූර්ණ ණය මුදලක් ගන්නවාට අපි විපක්ෂයේ මන්ත්‍රීවරු හැටියටත්, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු හැටියටත් සියලු දෙනාගේම විරුද්ධත්වය ප්‍රකාශ කරන්න කියන ඉල්ලීම මම මේ අවස්ථාවේ කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා**

ගරු සභාපතිතුමනි, මේ ආදාහනාගාරයත්, ප්‍රධාන ගොඩනැගිල්ලත් ඉදි කිරීම සම්බන්ධව සතුටින් කැමැත්තෙන් හිටපු කෙනෙක් මම. ආදාහනාගාරය හදන එකට කිසිදු විරෝධතාවයක් නැහැ. ඒක හදන එකට කැමැතියි ඒ ස්ථානයත් සුදුසුයි. හැබැයි ගැටලුවක් විදිහට ගරු සභාපතිතුමනි, අපි ගන්න ණය මුදල තුළ අපේ හිර වීම ගැන හිතන්න ඕනි. මන් හිතන්නේ ලක්ෂ තුන තුන හැම මාසයකම යනකොට, ගැටලු ඇති වෙන නිසා තමා මෙතන යටින් සඳහන් කරලා තියෙන්නේ "බැරිවෙලාවත් වාරිකය ගෙවා ගන්න බැරි වුණොත් උසාවි දඩ හා මුද්දර ගාස්තුවලින් රදවාගන්නේ" කියලා. හැබැයි අපේ ගරු මොහාන් මන්ත්‍රීතුමා සඳහන් කරා වගේ අපි මේ ක්‍රමයට කැමති නැහැ. මොකද අපේ දඩ හා මුද්දර ගාස්තුවලින් තමා අපේ සභාව යම්තාක් දුරට ගෙනියන්නේ.

මේකෙන් තමා සභාව කරගෙන යන්න යම්කිසි හයියක් රුකුලක් ලැබෙන්නේ. දැන් මුද්දර ගාස්තු එහෙම අඩුයි උසාවි දඩවලින් තමා යම්කිසි ප්‍රමාණයක් සම්පූර්ණ වෙන්නේ. ඒ නිසා මේ ක්‍රමය තුළින් ගියොත් ලොකු අපහසුතාවයකට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. ඔබතුමාත් මුල් සභා වාර කිහිපයකම කීවා "මේ සඳහා මම කටයුතු සිදු කරලා තියෙන්නේ, මේ ගොඩනැගිල්ල සහ ආදාහනාගාරය හදන්නත් මුදල් වෙන් කරගෙන තියෙන්නේ. ඒ පිළිබඳව අපි කාටවත් හය වෙන්න එපා" කියලා. ගරු සභාපතිතුමා ඒ කටයුත්ත සිද්ධ කරන නිසා අපි හයක් නැතුව බොහොම සතුටින් හිටියා. හැබැයි දැන් හය වෙන්න කාරණයක් ඉදිරියට ඇවිල්ලා තියනවා. මුද්දර ගාස්තු සහ දඩ මුදල් මේකට යොදවලා ණය මුදලක් ගන්න එක.ඒ නිසා මම මේ අවස්ථාවේදී ඒ පිළිබඳව කණගාටුව ප්‍රකාශ කරනවා. මාළු කඩය සම්බන්ධව කර ගන්න බැරි වෙලා අපි හිර වුණා. දෙවනි වරත් මේ වගේ දේවල් නිසා කොමසාරිස්වරයාට හෝ වෙනත් කෙනෙකුට යටත්ව මේ සභාව ගෙනියන්න සිද්ධ වුණොත් ඒක ඉතාමත් ශෝකජනක අවස්ථාවක්. සමහර විට ඔබතුමාට නොවෙන්න පුළුවන් ඒත් ඊළඟට එන සභාපතිවරයාට ණය බර ගෙවන්න සිද්ධ වෙනවා.

ඒවගේම ගරු සභාපතිතුමා මාළු කඩය ගැන කතා කරපු නිසා කියන්නේ අද ජංගම මාළු රථයකුත් යනවා. අපේ සභාවේ නීතියක් සහ සම්මත කරපු දෙයක් තියනවා. මේ සභාව තුළ ටෙන්ඩර් කරලා මාළු කඩයක් කරනවා නම්, ජංගම වෙළඳාමක් කරන්න බැහැ කියලා. දුම්රියපොල අසල අපේ මාළු කඩයක් තිබ්බා. නමුත් දුම්රිය පොල හදන නිසා එතනින් අපේ මාළු කඩය ඉවත් වුණා. හැබැයි ඒ කියලා අලුතෙන් ජංගම වෙළඳ සැලක් පවත්වාගෙන යනවා නම් ඒක කණගාටුවට කරුණක්. ගරු සභාපතිතුමා කීවා සභාවට අයවිය යුතු ලක්ෂ පහක මුදල කිසිම අවස්ථාවකවත් අඩු වෙන්න දෙන් නැහැ කියලා කීවා. මේ විදිහට කටයුතු කරලා වක්‍රාකාරයෙන් ඉවත් කරන්න හදනවා නම් ඒක කණගාටුවට කරුණක් මොකද ඒක සභාවේ නීතිරීතිවලට පටහැනි කරුණක්. විශේෂයෙන්ම නගරය ගැන කතා කරපු නිසා කියන්න වෙනවා. අද අපි කණගාටුව ප්‍රකාශ කරනවා මේසභාවේ දූපත් කොටස ඉදි කරන්න කියලා අපි ඉල්ලීමක් කරා, නමුත් දැන් හැප්පිලාම මැරියන් කියලා කඩ ඉරක් ගහලා තියනවා.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීවරුනි, ඔබතුමාලා මොනවා කීවත් මේක වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා**
ගරු සභාපතිතුමනි, මේක වෙනවා නම් තනි ඉරක්වත් ගහන්න ඕනිනේ.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීවරුනි, හැමදාම මට ඔය ප්‍රශ්නය යොමු කරනවා ඕක මාර්ග සංවර්ධන අධිකාරියේ . ඔය වැඩ යන විදිහ තමා. මම නිතර සම්බන්ධීකරණ වැඩේ කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඔබතුමා සම්බන්ධීකරණ වැඩේ කරලා හරි මේ ගැන සභාපතිවරයා වශයෙන් කතා කරන්න. ඔබතුමාගේ බලය තමා හැල්ලු වෙන්නේ. ඔබතුමා මේ නගරයේ ප්‍රධාන පුරවැසියා.මේකෙන් අපේ මිනිස්සුන්ට තමා හානි වෙන්නේ. අපේ මුදල් මේ වියදම් කරන්නේ. ජනතාවගේ මුදල් නාස්ති කරන්නේ. ඒ පිළිබඳව ඔබතුමා දැනුවත් වෙලා කතා කරන්න. එහෙම නැත්නම් මාර්ග සංවර්ධන අධිකාරියේ හරි මොනවා හරි ආයතනයක හරි අපිට කතා කරන්න අවස්ථාව දෙන්න. ඒ අවස්ථාව උදා කරලා දෙන්න කියන ඉල්ලීම කරනවා. ඇත්තටම ගරු මොහාන් මන්ත්‍රීතුමාත් මීට වැඩිය කල්පනාකාරී වන්න. කරුණාකරලා මේ යෝජනාව සුභවාදී විදිහට ගේන්න. ඔබතුමාට සම්බන්ධතා තියන නිසා තව සල්ලි හොයන්න පුළුවන්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ගරු යත්තල්ගොඩ මන්ත්‍රීතුමා මතුකරපු මාළු ලැලි ප්‍රශ්නයේදී ඇත්තටම සභාවේ ටෙන්ඩර් එක ගත්තට ලක්ෂ පහක් ගෙවා ගන්න තරම් ආදායම ඒ පුද්ගලයාට අතන වෙළඳාමෙන් නැහැ. ඔහු මේ මුදල ගෙවන්න බැදිලා ඉන්නවා. ටෙන්ඩර් එකක් ගත්ත කෙනා තමා දන්නේ ඒකේ අපහුසතාවය. නන්දන මහතා ඇත්තටම අසරණ තත්වයක ඉන්නේ. ඒක හිතන්න වෙනවා.

අනිත් එක තමා අයිලන්ඩ් එකේ ප්‍රශ්නය. මේකේදී අපි ගරු සභාපතිතුමා විශේෂ මහසභාවක් ඉල්ලුවා. අපි දැනන් හිටියා එතනින් එහාට යන්න බැහැ කියලා. ඒත් විශේෂ මහසභාවක් අවශ්‍ය නැහැ මා කෙරේ විශ්වාසය තියන්න කීවා. අපි විශ්වාස කරන්නේ මූලාසනයයි. අපි ප්‍රශ්නයක් එනවා නම් රැක ගන්න බලන්නේ මූලාසනයයි. සභාපති කියන ගෞරවය හා ඒ තියන හිමිකම එක්කනේ අපි යන්නේ.

අපි කීවේ අඩි දෙකක අයිලන්ඩ් එකක් යොදලා මේ කටයුත්ත කරන්න කියලා. කුරුණෑගල චීෆ් ඉංජිනියර් මහතාටත් කීවාම එතුමා කීවේ කුරුණෑගල වගේ අඩි දෙකක් පාරෙන් එහා පැත්තට පැන ගන්න තිබ්බොත් ඇති කියන තැන තමා මාත් ඉන්නේ කියලා. ගරු චමින්ද මන්ත්‍රීතුමා, ගරු අතුකෝරාල මන්ත්‍රීතුමා අපි තුන් දෙනා සම්බන්ධීකරණ කමිටුවට සහභාගි වුණා. ගරු සභාපතිතුමත්, උප සභාපතිතුමියත් ඉන්නවා. එතනදී RDA එකේ ප්‍රශ්නය ආවා. එවේලෙහි මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරීතුමිය “අයිලන්ඩ් එකට සමහරක් අය කැමති සමහරක් අය අකමැතියි” කියලා කියනවා. ඒ ප්‍රකාශය හරි වැරදියි. නින්දිතයි. අපි කීවා අඩි දෙකක අයිලන්ඩ් එකක් දාන්න හැරවුම් පහක් තියනවා ඒ හැරවුම් පහ දෙන්න කියලා. මේගොල්ලෝ අයිලන්ඩ් එක දානකොට ගරු සභපතිතුමාට කතා කරන්න වගකීමක් තියනවා. මේ නගරයේ පළමු පුරවැසියා, නාගරික කොට්ඨාසයේ මන්ත්‍රීවරයා. මේ RDA නිලධාරීන් සහ මන්ත්‍රී මණ්ඩලයේ 25දෙනායි එකතු කරලා සාකච්ඡාවක් තිබ්බා නම්, මේක අඩි දෙකේ පළලට යන්න ඕනි කියලා ඊට එහා අපිට අවශ්‍ය නැහැ කියලා අපි කියනවානේ. ඒ නිසා RDA එක කැඳවන්න. පාරේ දාන්න තිබ්බ අයිලන්ඩ් එක දාන් නැතිව නවත්තලා ඒ කට්ටිය ලොකු මූල්‍ය හානියක් කරේ. කාපට් එක කපලා ලක්ෂ 50 ක විතර බඩු ගෙනල්ලා සමූපකාරය ඉදිරිපිට බෑවා. එදා ඒ හානිය වෙන්න කලින් RDA එකට කෙලින් තීන්දුවක් ගන්න තිබුණානේ. මූල්‍ය අක්‍රමිකතාවක්. මම 2006 ඉඳලා මේකේ වෙන්න ගිය සියලු වැරදිවලට විරුද්ධ වෙච්ච කොයි පක්ෂයේ හරි හොඳ යෝජනාවක් ගෙනාවනම්, අත් දෙක උස්සලා හැමවෙලාවේම සහාය දීපු දේශපාලනඥයෙක් හැටියට ඉතිරි ටික කරන්න කලින් RDA එකට සාකච්ඡාවකට එන්න කියන්න. මේ ප්‍රශ්නයේදී ලේකම්තුමියටවත්, ගරු සභාපතිතුමාටවත් කතා කරන්නෙත් නැහැ එයාට ඕනි තීරණ අරන් කරනවා. ගරු සභාපතිතුමා ඒ ගැන අවබෝධයෙන් කටයුතු කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා**

ගරු සභාපතිතුමනි, සියලු දෙනාගෙන්ම අවසරයි. ගරු සභාපතිතුමා සහ ගරු මොහන් මන්ත්‍රීතුමාට පසුව නගරයට මම සම්බන්ධ වෙන්නේ. ඒ නිසා විශේෂයෙන්ම සඳහන් කරන්නට ඕනි අපි කතා කරේ ආදාහනාගාරය සම්බන්ධවයි. අපි 13 දෙනා පමණක් නොව අපි 26 දෙනාම ආදාහනාගාරය හදන්න ඒකමතිකව කැමතියි. නමුත් සභා වාරික දෙකක් තුනක් යද්දී මට මතකයි ඔබතුමා සඳහන් කරා රජයේ සල්ලිවලින් ආදාහනාගාරය හදනවා කියලා. මීට පෙරත් ඔය ප්‍රශ්නය එනකොට මම කීවා ඇයි ගරු සභාපතිතුමා රජයෙන් නේද මේක හදනවා කීවේ කියලා. එතකොට මේ කටයුත්ත කරනවාට අපිට කිසිදු ගැටලුවක් නැහැ. පොල්ගහවෙල, නාරම්මල, පන්නල මේ හැමතැනම සභාවල ගත්තාහම පාරවල් ටික හැදිලා, ආදාහනාගාර හැදිලා, ළමා උද්‍යාන ටික හැදිලා. අලව්ව ගත්තාහම මම දන් නැහැ මොකක්ද තියන තත්වය කියලා. ඉතින් මම නම් හිතුවේ ඔබතුමන්ලා මේ රජය භාර ගත්තාට පස්සේ මේ අලව්ව සුරපුරයක් කරයි කියලා. අද අලව්ව ගත්තාහම ඉතාම මලානික ස්වරූපයක් තියෙන්නේ.

ඔබ තමුන්නාන්සේලාට තේරුම් කරන්න ඕනි. අපේ රජයකින් තමා අලව්ව සංවර්ධනය කරන්න සල්ලි ගෙනාවේ. කණගාටුයි කියන්න ඔබ තමුන්නාන්සේලාට මේකේ තවම ඉරවත් ගහ ගන්න බැහැ. ඔබතුමා මේ ආයතනයේ ප්‍රධානියා, අලව්ව නගරයේ ප්‍රධාන පුරවැසියා විදිහට ඩිසිෂන් මේකින් කියන එක අනිවාර්යයි. එතකොට යම්කිසි තීන්දුවක් ගත්තා නම් ඒ තීන්දුවට අදාලව වැඩ කටයුතු කරන්න. ඒ නිසා මන් හිතන්නේ ගරු සභාපතිතුමනි ඔබතුමාගේ පූර්ණ බලතල ඒවගේම අධිකාරී බලය හැම එකක්ම කැටි කරලා තමා අලව්වේ ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා විදිහට ඔතන ඉන්නේ. ඒ නිසා පක්ෂ පාට බේද කෙසේ වෙතත් පාරේ බැහැලා යන අපෙන් හැම අවස්ථාවේම අහනවා ඇයි මෙහෙම වෙන්නේ මොකක්ද මේකට ගන්න තීන්දු තීරණ කියලා. එතකොට අපි කවදාවත් පහත් තත්වයේ වැඩ කරන් නැහැ ගරු සභාපතිතුමා. අපි පාවා දෙන්නෙත් නැහැ සභාවක් විදිහට තමා වැඩ කරන්නේ කියලා. RDA එක කරන්නේ කියලා අපි කියනවා. නමුත් මේ අයිලන්ඩ් එක ඉදි කිරීම සම්බන්ධව වෙනම වැරදි විදිහකට යන්නේ. ඔබතුමාගේ හිතවත්තු කරන ඉල්ලීමකට මේ අයිලන්ඩ් එක කරන් නැහැ කියන පණිවිඩයත් මිනිස්සු අතර යනවා. ඒ නිසා ඔබතුමාට මේකෙන් ගැලවෙන්න තියන හොඳම මාර්ගය තමා ඔබතුමා මේක කරලා පෙන්වන්න. ඒ යන ගමනේදී අපි සියලු දෙනාම ඔබතුමත් එක්ක ඉන්නවා.

අලව්ව නගරය ගැන කතා කරාම ඉතාම කණගාටු දායක දෙයක් ගැන කතා කරන්න ඕනි. ගරු සභාපතිතුමනි ඇත්තටම වෙසක් පොහොය කියන්නේ බෞද්ධ අපිට උතුම් පොහොයක්. ගරු ලේකම්තුමිය මේ ගැන දන්නවාද දන් නැහැ. වෙසක් පොහොය දවසේ අලව්වේ කිසිදු වැඩසටහනක් තිබ්බේ නැහැ. කොඩියක් තිබ්බේ නැහැ. ඇත්තටම අපි ලැජ්ජා සහගත විය යුතුයි.

අලව්වේ කොඩියක් කොහේ හරි දාලා තිබ්බා නම් මට කියන්න. වෙන කාලවලදී සභාව මූලික වෙනවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, වෙළඳ ප්‍රජාව මූලික වෙනවා.මේ වෙද්දී මේ සම්බන්ධීකරණය සම්පූර්ණයෙන් ගිලිහිලා ඉවරයි. පන්සල් පාඩුවේ වැඩ. බෝධියේ පන්සලේ, රාහුල පිරිවනේ, වැරැල්ලගම පන්සලේ, එකේ කණුවේ පන්සලේ හාමුදුරුවරු තම තමන්ගේ වැඩ ටික කරා. අපි මේ පොදු කමිටුවල හිටියා නම් මොනවා හරි යෝජනා ගේනවා. ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයේ වැඩක් විදිහට තමා නම යන්නේ. අලව්වේ වැඩපිළිවෙලක් නැති එක සම්බන්ධයෙන් දෝෂදර්ශනයට ලක් වුණා. නගර සංවර්ධන වැඩසටහන යටතේ පොසොන් එකේවත් ඔබතුමා මූලික වෙලා වැඩසටහන් ටිකක් කරන්න. බල්බ් වැල් ටිකක් දාන්න සභාවේ අපි අනුමත කරලා දෙන්නම්.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා සභාව ඉස්සරහින් ගිහිල්ලා නැහැ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා**
ගරු සභාපතිතුමනි, දන්සල දැක්කා.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රිතුමනි, පාලම ළඟ කොඩි දාලා තිබ්බා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා**
ගරු සභාපතිතුමනි, අලව්ව නගරය කියන්නේ සභාව ඉස්සරහාද

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රිතුමනි, නාරම්මල පාරේ තිබ්බා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා**
ගරු සභාපතිතුමනි, නාරම්මල පාරේ කාල්ටන් එකේ ළමයි දාපු කොඩි තිබ්බා. නගර කියන්නේ පොළ ගාව නෙවේ. අඩුපාඩුවක් කියන්නේ ගරු සභාපතිතුමා ඒක පිළිගන්න. මේ කමිටු රැස්වෙලා ඔයගොල්ලෝ මොකක්ද කරන්නේ. ඔබතුමන්ලා කමිටුවක් දාන්න අපි උදව් කරනවා. අපි බෞද්ධයෝ විදිහට මේ කටයුතු කරන්න කියන ඉල්ලීම කරනවා. ඊළඟට අයිලන්ඩ් එකේ ප්‍රශ්නයේදී යකඩ වැටක් ගහන්න පුළුවන් ගරු සභාපතිතුමා ඒකෙන් කිසිදු කෙනෙක්ට හානියක් වෙන් නැහැ. ඒ වගේම ඔබතුමා ගුවන් පාලම අලව්වට ගේනකල් මම ඉතාමත් සතුටින් බලන් ඉන්නවා. අපේ කිසිම කුහකත්වයක් නැහැ. ඒ නිසා ඉතාමත්ම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා නගර සංවර්ධනයේදී අයිලන්ඩ් එකේ ප්‍රශ්නය විසඳන්න. ඒ වගේම ආදාහනාගාරය ගැන කතා කරද්දී ඔබතුමාට දෙන්න පුළුවන් උපරිම සහයෝගය ලබා දෙනවා. ණය ගන්න ගියොත් මන් හිතන්නේ කිසිම කෙනෙක් කැමැත්තක් දක්වන් නැහැ. ඒ වගේම පොසොන් එකේවත් ගරු ලේකම්තුමියගෙන් ඉල්ලා සිටිනවා ගරු සභාපතිතුමාත් එක්ක කතා කරලා කමිටුවක් හරි දාලා කොඩි ටිකක් පාර හරහා දාන්න කියලා ඉල්ලා සිටිමින් නතර වෙනවා බෙහෙවින් ස්තූතියි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, මම අයිලන්ඩ් එක සම්බන්ධව මේ කතා කරන්නේ.මේකේ මූලික වැරදිකාරයා සභාපතිතුමනි ඔබතුමායි. ඒක පැහැදිලිව භාර ගන්න ඕනි. අපි ඔබතුමාගෙන් ඉල්ලීමක් කරා විශේෂ මහසභාවක් කැඳවලා තීරණයක් ගමු කියලා. ඇත්තටම මේ මන්ත්‍රී කණ්ඩායම ඔබතුමා ගැන පූර්ණ විශ්වාසය තිබ්බානේ. ගරු සභාපතිතුමනි, නාගරික සංවර්ධන අධිකාරියේ සහ මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරීන් සියලු දෙනා එක තැනකට සාකච්ඡාවක් සඳහා කැඳවලා දෙන්න. ඔබේ සහ අපේ තිබ්බ බලය නාගරික සංවර්ධන අධිකාරිය අරගෙන ගිහිල්ලා තියෙන්නේ. ඒ වගේම මහජන නියෝජිතයෙක් හැටියට නාගරික සංවර්ධන කමිටුවේ ඔබතුමානේ ඉන්නේ. මේ සංයුතිය වෙනස් කරලා විපක්ෂයත් ගෙන්වන්න. ඔබතුමාට තනියෙන් උත්තර දෙන්න බැරි නම් වටේ මහජන නියෝජිතයෝ පිරිසක් ඉන්නවානේ. ඒගොල්ලෝ හරි ඇතුළත් කරගන්න. එහෙම යෝජනාවක් ගේන්න ඒවා සංශෝධනය කරගන්න. එහෙම නැත්නම් අපෙන් ගිලිහී ගිය බලය නැවත ගන්න කතා කරන්න. අපේ බලය වෙන කෙනෙක් අතට දෙන එකට හැමදාම මම විරුද්ධයි. ආදාහනාගාරය ඉදි කරන එක අත්‍යාවශ්‍ය කාරණයක්. ඒක මේ ප්‍රදේශයේ තියෙන්න ඕනි. ආදාහනාගාරය ඉදි කිරීම සඳහා අපේ උසාවි දඩ හා මුද්දර ගාස්තු කොමසාරිස්තුමාගේ පාලනයට යොමු කරන යෝජනාවට මගේ පැහැදිලි විරෝධතාවය ප්‍රකාශ කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්. ප්‍රියන්ත උපුල් කුමාර කරුණාරත්න මැතිතුමා**
ගරු සභාපතිතුමනි, අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ආදාහනාගාරයක් කියන්නේ සිහිනයක්. ඒ සිහිනය යථාර්ථයක් කරන්න ඔබතුමා කරපු කැපකිරීම සම්බන්ධව අපි හදවතින්ම ආඩම්බර වෙනවා. නමුත් ඒකේදී මේ ණය මුදල ගෙවා ගන්න බැරි වුණොත්,දඩ හා මුද්දර ගාස්තුවලින් ගෙවීමට ඔබතුමා යෝජනා කරනවා. ගරු සභාපතිතුමනි, මේකේ ගැටලුවක් තියනවා. දඩ හා මුද්දර ගාස්තු කියන්නේ නිශ්චිත ආදායමක් නෙවේ. අඩු වැඩි වෙන්න පුළුවන්. නැත්තටම නැති වෙන්නත් පුළුවන්. ඒ නිසා අපි ඒ වගේ බැරෑරුම් තත්වයකට නොගිහින්, මේක ඉදිරි සභා වාරයකදී සාකච්ඡා කරලා මේකට රජය පැත්තෙන් උපරිම සහයෝගය ගන්න විදිහට සැලසුමක් හදමුයි කියලා යෝජනා කරමින් මා නිහඬ වෙනවා ස්තූතියි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.චමින්ද මාල් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, අපි සියලු දෙනා එදා පළමුවෙනි සභා වාරයේදීම කැමැත්තෙන් හිටියා සහ සියලු මන්ත්‍රීවරු ඉල්ලපු එකම දේ තමා මේ ආදාහානාගාරය ඉදි කිරීම. ඒ එක්කම මේකේ ගොඩනැගිල්ල ඉල්ලුවා. ඔබතුමා හය නැතුවම කීවා මම මේවාට සල්ලි ගේනවා කියලා. මොකද ඔබතුමාගේ මේ යෝජනාවෙන් එහෙම එකක් පේන්නේ නැහැ. මන්ත්‍රීවරු ගොඩාක් අඩුපාඩු ගැන කතා කරා. ඔබතුමා ආසන්නම කාලයේ ගත්ත තීරණය තමා මාළු කඩයට ගත්ත තීරණය. අපි දැඩි ලෙස විරුද්ධ වෙනකොට ඔබතුමා ගෙනාපු කතාව අපිට විශ්වාස කරන්න බැරුව ගියා. එතුමා ඒ මාළු කඩය දැම්මා. අද අලව්ව නගරයේ ප්‍රධාන මාර්ගයේ තත්වයත් ඒකයි. එතකොට ආදාහනාගාරයේ වැඩ ටිකත් මෙන්න මෙහෙම වෙයිද කියලා මට සැකයක් තියනවා. ආදාහනාගාරයට ඔබතුමා ගේනවා කියපු සල්ලි එනවාද නැද්ද කියන ප්‍රශ්නය තියනවා. ඔබතුමා සල්ලි ගේනවා කීවාහම අපි හරි කැමති වුණා. ඔබතුමාට මේ සභාවේ සියලු මන්ත්‍රීවරුන්ට වැඩිය ලොකු හයියක් බලයක් තියනවා. අපි ඒක දන්නවා. නමුත් ඔබතුමාට ඒක කරගන්න බැරි වුණා. ඔබතුමා ණය ගමු කියලා අපෙන් ඉල්ලනවා. අපි ඒකත් මේ සභාවේ අනුමත කරා. නමුත් ඔබතුමා සම්පූර්ණ මුදලම ණයට ගමුයි කියනකොට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරයා හැටියට මගේ විරෝධතාවය ප්‍රකාශ කර සිටිනවා. ඔබතුමා මේ ගැන සාකච්ඡා කරලා හොඳ යෝජනාවක් ගේන්න. ඒ යෝජනාවේදී අපි ඉන්නවා නමුත් මේ යෝජනාව සමඟ නෙවේ. බොහොම ස්තූතියි.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීවරුනි, ආදාහනාගාරය කියලා කියන්නේ අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඉන්න ජනතාවගේ 95%කගේ සිහිනය මගේ විතරක් නෙවේ. අකමැති 5% ක් ඉන්නවා. ඔබතුමාලා දන් නැහැ. මේ සමාජයේ හැටිනේ. මේ ආදාහනාගාරය සඳහා පළාත් නිශ්චිතවලින් කෝටියක් ලැබිලා තියනවා. මේ මිලියන විස්සෙන් නෙවේ කරන්නේ. එතකොට අමාත්‍යාංශය මට්ටමින් එක් කෝටි විසිපන් ලක්ෂයක මුදලක් අනුමත වෙලා තියනවා. ඊට අමතරව තමා මේ මුදල. මම දන්න විදිහට කුරුණෑගල දිස්ත්‍රික්කය ගත්තත්, ලංකාවම ගත්තත් ගොඩාක් තැන්වල දේශීය ණය සහ සංවර්ධන අරමුදලෙන් තමා ණය අරන් ආදාහනාගාර හදලා තියෙන්නේ. කුරුණෑගල දිස්ත්‍රික්කයේ 80%ක්ම. ඔබතුමන්ලා ඔය කියපු සභාවලට කෝල් කරලා බලන්න. මේ ණය මුදල පොඩි පොලියකටනේ දෙන්නේ. අපිට වැඩමුළුවක් තිබ්බ වෙලාවක මම මේකට ගියා. ඒ වෙලාවේ මගේ ඔළුවට ආවා මේකෙනුත් පොඩි මුදලක් ගත්තොත් හොඳයි කියලා. මෙහෙම කපා ගන්න දේශීය ණය එකෙන් මේ කොන්දේසිය ඉල්ලනවාලු. මේ ආදාහනාගාරයට ලැබිච්ච මුදල් ටිකක් තියනවා. කෝටි දෙකයි ගානක් තියනවානේ. ඊට අමතරව ඔබතුමාලා ඔය කියපු දේවල් එක්ක මේකට යම් මුදලක් හොයා ගන්න බැරි වෙන එකක් නැහැ. ඒ නිසා අපි මේකට අදාල ඉතුරු මුදල් ටික හොයා ගන්න උත්සාහයක් ගමු. මේ සම්බන්ධව ලබන සභා වාරයේදී නිවැරදි සාකච්ඡාවක් සිදු කිරීම සඳහා එකඟතාවයකට යමු. ඒ නිසා මෙම යෝජනාව ඊළඟ මහසභා වාරය සඳහා කල් තබනවා.

ඒ අනුව, අලව්ව ප්‍රාදේශීය සභාවට අයත් දවටගොල්ල සුසාන භූමිය පිහිටි ඉඩමේ ඉදිකිරිමට යෝජිතව ඇති නව ආදාහනාගාරය සඳහා දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් ලබා ගැනීමට නියමිත රු.මිලියන 20 ක ණය මුදල මාසික වාරික 120 කින් ගෙවීමටත්, යම් හෙයකින් එම මුදල ගෙවීමට අපහසුතාවයක් ඇතිවුවහොත් එම මුදල සභාවට අයවිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තුවලින් අය කර ගැනීමට පළාත් පාලන කොමසාරිස්ට බලය පැවරීම අදාල යෝජනාව ඊළඟ මහසභා වාරයේදී සාකච්ඡා කිරීම සඳහා කල් තැබීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**යථා පරිදි කල් දී නොමැති යෝජනා**

**(05.8) ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන අංක 07/15/05/08 දරණ යෝජනාව**

මහරච්චිමුල්ල,ගල්ඔලියාව, විහාරකන්ද ලිපිනයේ පදිංචි එච්.පී. කුමාෂි ශිවන්ති ජයවීර යන අය විසින් සාරගම වෘත්තිය පුහුණු අධිකාරියේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පාඨමාලාවක් හදාරා ඇති බැවින් මාස 06ක ප්‍රායෝගික පුහුණුවක් සඳහා අලව්ව ප්‍රාදේශීය සභාවේ අවස්ථාව ලබා දෙන ලෙස 2026.06.12 දින ඉල්ලීම් ලිපියක් යොමු කර ඇත. ඒ අනුව, මහරච්චිමුල්ල,ගල්ඔලියාව, විහාරකන්ද ලිපිනයේ පදිංචි එච්.පී. කුමාෂි ශිවන්ති ජයවීර යන අය හට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පාඨමාලාවට අදාලව මාස 06ක ප්‍රායෝගික පුහුණුවක් ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, මහරච්චිමුල්ල,ගල්ඔලියාව, විහාරකන්ද ලිපිනයේ පදිංචි එච්.පී. කුමාෂි ශිවන්ති ජයවීර යන අය හදාරා ඇති තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පාඨමාලාවට අදාලව අලව්ව ප්‍රාදේශීය සභාවේ මාස 06ක ප්‍රායෝගික පුහුණුවක් ලබා දීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05.9) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්. ප්‍රියන්ත උපුල් කුමාර කරුණාරත්න මැතිතුමා විසින් කරනු ලබන අංක 07/15/05/09 දරණ යෝජනාව**

අලව්ව ප්‍රාදේශීය බල ප්‍රදේශය තුළ ස්ථාපිත කර ඇති වීථි පහන් රාත්‍රී කාලයේදී මහජනතාවගේ ආරක්ෂාවට/ මාර්ග ආරක්ෂාවට මෙන්ම සමාජ ආරක්ෂාව උදෙසා සුවිශේෂී වූ සේවාවක් ඉටු කරනු ලබයි. එහෙත් බොහෝ ස්ථානවල මෙම වීථි පහන් රාත්‍රී කාලයෙන් පසුව නිසි පරිදි නිමා නොදැමීම හේතුවෙන් දිවා කාලයේ වැඩි කාලයක් තුළ මෙන්ම ඇතැම් ස්ථානවල අඛණ්ඩව දිනය පුරාවටම දැල් වී තිබීම හේතුවෙන් විශාල ලෙස විදුලිය අපතේ යාමක් සිදුවන බව නිරීක්ෂණය වේ. මෙම තත්වය මඟ හරවා ගනිමින් සිදුවන මානව අපහසුතා වළක්වමින් වීථි පහන් මඟින් සිදුවන අනවශ්‍ය විදුලි නාස්තිය අවම කිරීමට අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථාපිත කර ඇති වීථි පහන් සඳහා අලෝක තත්වය අනුව ස්වයංක්‍රීයව ක්‍රියාත්මක වන ON/OFF පද්ධතියක් ස්ථාපිත කිරීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්. ප්‍රියන්ත උපුල් කුමාර කරුණාරත්න මැතිතුමා**
ගරු සභාපතිතුමනි, මෙම යෝජනාව ගේන්න ප්‍රධාන හේතුව මෑත කාලයේ ලොකු විදුලි අර්බුදයකට ආවා. නමුත් විදුලි බල්බ් දල්වන නිවෙස් හිමියන් කොතරම් දැනුවත් කරත් ඔවුන් ඒක කනකට ගන් නැහැ. පාර යන කෙනෙක් නිමුවොත් ඇරෙන්න සමහර අවස්ථාවල දවස පුරාම බල්බ් දැල් වෙනවා. ඒක ලොකු ගැටලුවක්. අනික ප්‍රාදේශීය සභාවට විදුලි බිල ගෙවන්න ආවොත් ලොකු බිලක් එනවා. අනිත් එක විදුලි බල පද්ධතියටත් මේක ලොකු හානියක්. රාත්‍රී කාලයෙන් පසුව බල්බ් නිවා නොදැමීමට හේතුව මිනිස්සුන්ගෙන් වෙන අතපසු වීමයි. මේක වැළැක්වීමට තමා ආලෝක තත්වය මත, ඒ කියන්නේ අඳුර වැටෙද්දී බල්බ් එක පත්තු වෙන විදිහටත්, උදෑසන එළිය වැටෙද්දී බල්බ් එක නිවෙන විදිහටත් ON/OFF ස්විච් පද්ධතියක් සවි කරන්න යෝජනා කරන්නේ. මේ සම්පූර්ණ ස්විච් පද්ධතිය රු.1000.00 ත් 2000.00ත් අතර මුදලකට හදන්න පුළුවන්. සමහර විට තොගයක් එකපිට ගන්නකොට මේක රු.1000.00ටත් වඩා අඩු වෙන්න පුළුවන්.ඊට අමතරව අපේ විදුලි කාර්මික නිලධාරියාට පුහුණුවක් ලබා දීලා එතුමා මඟින් මේක සවි කරගන්න පුළුවන් නැත්නම් මේක පිටතින් හරි සවි කරගන්න පුළුවන්. මේක අපි අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ තෝරාගත් කොටසකට නැත්නම් අලව්වේ නගර සීමාවේ හරි, වෙනත් ප්‍රදේශයක හරි ස්විච් පද්ධතිය සවි කරලා ක්‍රියාකාරීත්වය කොහොමද කියලා බලන්න පුළුවන්. මේක විශේෂයෙන්ම අපිට අවශ්‍ය වෙන්නේ අනවශ්‍ය විදුලි නාස්තිය වළක්වා ගැනීමටයි. ඒක අපිට ක්‍රියාත්මක කරන්න හැකි වුණොත් ලොකු සේවයක් සැපයෙනවා කියලා මම හිතනවා. ප්‍රධාන විදුලි පද්ධතියට ලොකු සහනයක් ලැබෙනවා ඒවගේම විදුලි අපතේ යාම වැළකෙනවා. ඒවගේම මිනිසුන් අතින් සිදුවන අතපසු වීමුත් අපිට වළක්වා ගෙන මේක ක්‍රමවත්ව සිදු කරගෙන යන්න පුළුවන් කියන හේතු මත තමා මම යෝජනාව ඉදිරිපත් කළේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජ්. චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, මගේ කොට්ඨාසයේ ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රියන්ත මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව ඉතාම කාලෝචිත හොඳ යෝජනාවක්. ජාතික විදුලි බල පද්ධතියට හොඳ පිළියමක්. ඒවගේම ගරු සභාපතිතුමා මේ සෙන්සර් එක සවි කිරීම සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතු කරුණක් තියනවා. හැබැයි අපේ දැන් තියන විදුලි බලය අක්‍රීය වුණොත්, බල්බ් එක පත්තු වෙලාම තියෙන් නැහැ. ඒක නිමිලා තමා අක්‍රීය වෙන්නේ. හැබැයි රැනගල වෙල මැද කඩේට එහා පැත්තේ සෙන්සර් එක දාලා සවි කළ ලයිට් එකක් තියනවා. ඒක අක්‍රීය වුණාම අපි ගිහින් හදනකල්ම ඒක පත්තු වෙනවා. ඒ හින්දා ඒ පිළිබඳවත් විශේෂ අවධානය යොමු කරන්න නැත්නම් අපි විදුලි බලය පිරිමහන්න ගිහිල්ලා විදුලි බලය මීට වැඩිය අපතේ යන වැඩකුත් වෙනවා. ඒ නිසා සෙන්සර් එක ගැලවීම සඳහා නිසි ක්‍රමවේදයක් පිළිබඳවත් විශේෂ අවධානයක් යොමු කරන්න කියන එක ගරු සභාවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ගරු ප්‍රියන්ත මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව බොහොම කාලෝචිත එකක්. ගරු වර්ණසූරිය මන්ත්‍රීතුමා කීවා වගේ අද තාක්ෂණය දියුණු නිසා ඕක ඕෆ් වෙලාම යන්න හදන්න පුළුවන්. හැබැයි ප්‍රශ්නය තියෙන්නේ ඒක පහළින් සවි කරොත් අද ලයිට් එක නිවලා යන් නැති කෙනා ඕක ගලවා ගෙන යනවා. ඒක නිසා ඕක නිවැරදිව උඩින් සවි කරන්න ඕනි කියලා කියනවා. මට ෆේස්බුක් එකේ දාලා තියනවා මන් හිතන්නේ ඔබතුමාගේ පොළ ළඟ"ලයිට් එක නැහැ අනේ ඒක දාලා දෙන්න කියලා". මම කීවා ගරු සභාපතිතුමා ඉන්නේ කියලා.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීතුමනි, ඔය කියන හැම වෙලාවකම ඒක හදනවා. එතන වෙන මොකක්දෝ හේතුවක් තියනවා.බල්බ් හතරකටම එක තැනකින් ස්විච් එක තියෙන්නේ. පස්සේ හොයා ගත්තේ මොකක්ද වෙන්නේ කියලා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඊට පස්සේ ඒ පුද්ගලයා හේතුව දාලා තියනවා එතන කුඩුකාරයන්ගේ තිත් පොලක්ලු කියලා. මම කීවා බල්බ් එක නිවනවා ඇති, එක්කෝ ගලවනවා ඇති එයාගේ ස්ථානය සුරකින්න වෙන්න ඇති කියලා. මන් ඉතින් ගරු සභාපතිතුමාට යොමු කරන්න කියලා දැම්මා.එහෙනම් බොහොම ස්තුතියි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, මේ රටේ බලශක්ති අර්බුදයක් තියන යුගයක ගරු ප්‍රියන්ත මන්ත්‍රීතුමා ඉතාම හොඳ කාලෝචිත යෝජනාවක් කළේ.ගරු අකිල මන්ත්‍රීතුමාගේ කොට්ඨාසයේ රැනගල වෙල මැද කඩේ ළඟ වීථි පහන නිවෙන් නැතිව එක දිගට තිබ්බා ඒකටත් අපි ක්‍රමයක් හදා ගමු. මිනිස්සු තමන්ගේ නිවසේ බල්බ් නිවනවා හැබැයි ගේ ඉස්සරහා බල්බ් එක නිවන් නැහැ. මේ අපේ මිනිස්සු කරන වැරදි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඉතාම හොඳ යෝජනාවක්. හැබැයි අපි 1997 වැඩපිළිවෙලක් කරා. එක දවසක් ගිහිල්ලා දැනුම් දෙනවා. ඊට පස්සේ දෙවනි දවසේත් ඒ විදිහටම බල්බ් එක පත්තු වෙනවා නම් සභාවෙන් ගිහිල්ලා ගලවා ගෙන එනවා. ඊළඟට ඒ කණුවේ "කැමති කෙනා වගකීම භාර ගන්න" කියලා සවි කරලා එනවා. ඒ විදිහටත් කරා. කාලය හරි මුදල් හරි යනවා නම් මේ විදිහටත් කරලා බලමු කියලා යෝජනා කරනවා.

ඒ අනුව, මානව අපහසුතා වළක්වමින් වීථි පහන් මඟින් සිදුවන අනවශ්‍ය විදුලි නාස්තිය අවම කිරීමට අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථාපිත කර ඇති වීථි පහන් සඳහා අලෝක තත්වය අනුව ස්වයංක්‍රීයව ක්‍රියාත්මක වන ON/OFF පද්ධතියක් ස්ථාපිත කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05.10) <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා විසින් කරනු ලබන අංක 07/15/05/10 දරණ යෝජනාව</u>**

නවතල්වත්ත, මොරගහමඩවත්ත ඉඩමේ කැනීම් කටයුතු දැනටමත් සිදු කරමින් පවතින අතර විශාල පිපිරවීම් කරමින් සිදුවන පරිසර විනාශයට කුඹුරු හිමියන් හා අවට ගම්වාසීන්ගේ දැඩි විරෝධතාවයක් මේ වන විටත් පැන නැගී ඇත.

මේ සිදුවන පරිසර විනාශයට විල්ගමුව වසමේ ප්‍රාදේශීය ලේකම්තුමිය සතුව පවතින, රජයේ ව්‍යාපෘතියකට යොදා ගෙන ඇති ඉඩමට යාබද ඉඩමේ පදිංචි සැමියා හා බිරිඳ විසින් ප්‍රදේශයේ පිරිසක් යොදා ගනිමින් බලපත්‍ර කිසිවක් නොමැතිව පස් ජාවාරම සිදු කරමින් රජය සතු ඉඩම විනාශ කරමින් පවතියි.

තවද රජයේ ඉඩම් පමණක් නොව බලපත්‍ර නොමැතිව අවට ස්වර්ණ භූමි ඉඩම්ද යන්ත්‍ර සූත්‍ර යොදාගෙන කැනීම් කටයුතු විශාල වශයෙන් මේ වන විටත් සිදු කරමින් පවතියි. මේ සිදුවන පස් ජාවාරම හා පරිසර විනාශය පිළිබඳව ප්‍රදේශවාසීන් විසින් අපව දැනුවත් කර ඇත. ඒ අනුව, අලව්ව ප්‍රාදේශීය සභාව තුළ ඉහත ස්ථාන දෙකේ සිදුවන අත්තනෝමතික ක්‍රියාවලිය හා විනාශය සම්බන්ධව රජයේ ආයතන දැනුවත් කරමින් නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීම සඳහා ලිපි මඟින් දැනුවත් කිරීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීවරුනි, අපි මේ ගැන සම්බන්ධීකරණ කමිටුවටත් ඉදිරිපත් කරලා එතනින් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවටත් යොමු කිරීමට වැඩ පිළිවෙලක් හදා ගමු. අනීතිකව සිදුවන මේ ක්‍රියාවලීන් සඳහා අපි මැදිහත් වෙනවා. ගියපාරත් විශාල උද්ඝෝෂණයක් කරලා තමා නවත්ව ගත්තේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඇත්තටම අපේ ප්‍රදේශයේ සිදුවන පරිසර හානිය සම්බන්ධව තමා විශේෂයෙන්ම දැනුවත් කරන්නේ. ඊට අමතරව අපේ සභා බල ප්‍රදේශයේ මාර්ගවලටත් විශාල හානියක් සිදු වෙනවා. ඒ මාර්ග නඩත්තුව පිළිබඳ දැනුවත් කිරීමටත් තමා ඉදිරිපත් කරන්නේ. මේ යෝජනාවේ අන්තර්ගතය මම සඳහන් කරන්නම්. අපි මොරගහමඩ වත්තේ සිදුවන පස් කැපීම මීට කලින් කිහිප වතාවක්ම නවත්වනන් උත්සාහ කරා. පසුගිය ආණ්ඩුවේත් මෙතන පස් කපන්න උත්සාහ කරා. හැබැයි හැම අවස්ථාවකම ප්‍රදේශයේ ජනතාව ඒකට විරුද්ධව නැගී සිටියා. විහාරස්ථානවල හාමුදුරුවෝ තමා මූලිකත්වය ගත්තේ. මේ පාර පොඩි ප්‍රශ්නයක් තියනවා. හාමුදුරුවරු පොඩ්ඩක් පස්සට යනවා. ප්‍රශ්නය මොකක්ද දන් නැහැ. නමුත් ජනතාවගේ උනන්දුව තියනවා. ඒ නිසා මේකට විරෝධය ප්‍රකාශ කරනවා.

අනිත් කාරණය තමා ආණ්ඩුවට මේකෙන් විශාල කැළලක් තියනවා. මොකද වත්මන් රජය අනිත් රජයන් දෙකටම වඩා වෙනත් ක්‍රමයකටනේ බලයට පත් වුණේ. එතකොට ඒ බලයට පත් වෙච්චි ආණ්ඩුව මේ වගේ දේවල් කරනකොට මිනිසුන්ගේ අප්‍රසාදය වැඩියි. ඒ නිසා ඔබතුමා මැදිහත් වෙලා ඒ පිළිබඳව කටයුතු කරන්න කියන ඉල්ලීම කරනවා. ඒ වගේම විල්ගමුව ප්‍රදේශයේ විශාල වශයෙන් සිදුවන පස් ජාවාරම නිසා මාර්ග පද්ධතිය විශාල වශයෙන් හානියට පත් වෙලා තියනවා. නමුත් අද තියන සංවර්ධනයත් එක්ක අධිවේගී මාර්ග හැදීම සඳහා පස් අවශ්‍යයි. හැබැයි ගරු සභාපතිතුමනි, ඒක කෙරෙන්න ඕනි නීත්‍යානුකූලවයි.මාර්ගවලට අවශ්‍ය මුදල් ප්‍රමාණය සභාවේ තැන්පත් කරලා ඒ අවසරය අරගෙන නීත්‍යානුකූලව ඒ කටයුත්ත සිදු කරනවා නම් අපිට ගැටලුවක් නැහැ. ඒ වගේ දේවල් සිදු වෙන්නේ අවශ්‍යතාවය සහ ඉඩම් හිමියන්ගේ කැමැත්ත අනුවනේ. හැබැයි මේවාට පරිසර බලපත්‍ර, කැණීම් බලපත්‍ර, සභාවේ බලපත්‍රයක් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බලපත්‍රයක් නැහැ. කිසිම දෙයක් නැතුව මේගොල්ලෝ මේ කටයුත්ත පොලීසියේ සහයෝගය ඇතිව අත්තනෝමතිකව කරගෙන යනවා. ඒ නිසා ඒ පිළිබඳව ඔබතුමාගේ සහ සියලු මන්ත්‍රීවරුන්ගේ කාරුණික අවධානය යොමු කරමින්, මේවාට බලපත්‍ර දීලා කටයුත්ත කරාට මගේ නම් ගැටලුවක් නැහැ. ඒ තැනට එන්න පුළුවන් නම් කරන්න නැත්නම් කරුණාකරලා මේවා අවලංගු කරලා අපේ සභාවේ මාර්ග පද්ධතියවත් ආරක්ෂා කරන්න කටයුතු කරන්න කියන ඉල්ලීම කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඇත්තටම අපේ ගරු සමන්ත මන්ත්‍රීතුමාට ස්තූතිවන්ත වෙනවා. මේ කොට්ඨාසයේ අපේ මන්ත්‍රීවරු දෙන්නෙක් ඉන්නකොට, මට වැඩිය මගේ ගමේ තියන ප්‍රශ්නය ගරු සමන්ත මන්ත්‍රීතුමා ඉදිරිපත් කරාට. මීට පෙර මේ කටයුත්ත සඳහා උදව් කරන්න කියලා මම ගරු මන්ත්‍රීවරු සියලු දෙනාගෙන්ම ඉල්ලා සිටියා.

මොරගහමඩවත්ත අක්කර 88 ක පුද්ගලික ඉඩමක්. ඒ ඉඩම ඇසෙට් කියන කම්පැණි එකට තමා අයිති. ඇසට් එකේ වර්තමාන අයිතිකාරයා මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ළඟ ඥාති පුද්ගලයෙක්. එදා මහින්ද රාජපක්ෂ මැතිතුමා සහ රනිල් වික්‍රමසිංහ මැතිතුමා අත්සන් කරපු,

පාර්ලිමේන්තුව සම්මත කරපු එක අපිට මහජන විරෝධතාවයකින් නවත්වන්න පුළුවන් වුණා. හැබැයි එදා හිටපු සන්ධ්‍යා කුමාර ගරු සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීවරු සියලු දෙනා තමා ඒකට කැමැත්ත දුන්නේ නැහැ. හැබැයි රටේ ගරු ජනාධිපති අත්සන් කරපු ලේඛනයට ගරු සභාපතිතුමා හිටගත්තා. අපි එදා උද්ඝෝෂණය කරලා නැවැත්තුවා.

ගිය ආණ්ඩුව අනුමත කරපු ලියවිල්ල මත තමා මේ සැරේ පර්මිට් එක දුන්නේ කියලා භූ විද්‍යා හා පතල් එකෙන් කියනවාලු. ඒ පර්මිට් එක දෙනකොට මහජන විරෝධයකින් මේක නැවතුණා කියලා ඒකේ කොහෙවත් සඳහන් වෙලා නැහැ. එතකොට එහෙන් දුන්න එක සාධාරණයි කියමුකෝ එතකොට ගමේ ග්‍රාම සේවක මහත්තයා අනුමත කරන්න ඕනි. එයාගෙන් ඇහුවාහම කියනවා මේක ජල මූල ප්‍රශ්නයක්. ඊට පස්සේ එක පැත්තක කෙනෙක්ගේ ගෙදරක ඉවුර කඩාගෙන ගිහිල්ලා අවධානම් කලාපයක් කියලා ගොඩනැගිලි පර්යේෂණ එකෙන් දීලා තියනවාලු. ඒ දෙක නිර්ණායක හැටියට දුන්නා කියලා එතුමා කියනවා. නමුත් ග්‍රාම සේවක මහත්තයා එහෙම දීලා නැහැ. මේකට ඒකාබද්ධ පරීක්ෂණයක් කරන්න ඕනි. ඉතින් ගම්වල මිනිස්සු අසරණ වෙලා තියනවා. අපි සියලු දෙනාටම උදව් කරපු අය ඉන්නවා. ඒ ගම අවට අයට ලොකුම හානිය ඒක. ඒකාබද්ධ පරීක්ෂණයක් කරනකොට ප්‍රාදේශීය ලේකම්තුමිය නිහඬ නම් ග්‍රාම සේවක, භූ විද්‍යා හා පතල් කැනීම්, පරිසර, පොල් සංවර්ධන, පුරා විද්‍යා එක මන් හිතන්නේ රාජ්‍ය ආයතන 15 කට වැඩිය ඔතන ඉන්න ඕනිඇයි මේ කට්ටිය ආවේ නැත්තේ? අනික මේක ඒ ශ්‍රේණියේ පොල් වත්තක්. ඔබතුමන්ලාගේ ආණ්ඩුවට ඇත්තටම චෝදනා කරන්න වෙනවා. ඔබතුමාලා එනකොට මින් ඉදිරියට මේවා කරන්න දෙන් නැහැ නිසි නියාමනයකින් තමා මේවා කරන්නේ කියලා කීවා.

මම විල්ගමුවේ එක ගැනත් හෙව්වා. ඊට වැඩිය ලොකු හානියක් එතන වෙන්නේ. රජයේ ව්‍යාපෘතියකට වෙන් කරලා තියන කොටසක්. එතකොට ඒකේ කොහෙවත් ඉන්න කීප දෙනෙකුට, හය හත් දෙනෙකුට මැෂින් දාගෙන ඒකේ කපන්න බලය කොහෙන්ද? එතකොට මේකේ ග්‍රාම නිලධාරී නිදිද? ප්‍රාදේශීය ලේකම් නිදිද? පොලීසිය, රාජ්‍ය ආයතන අනිත් අය නිදිද? මිනිස්සු මෙහෙම කියනකොට සභාවක් හැටියට අපි මොකද කරන්නේ. ඉඩම අයිති නැති වුණාට ප්‍රදේශය අයිතියිනේ. ඇයි අපි මේකට නිහඬව ඉන්නේ? ඔබතුමා එක්ක අපි හැමවෙලේම ඉන්නවනේ. අධිවේගී මාර්ගයට නෙවේනේ පුද්ගලිකව වැඩ කරන්න අවශ්‍යතාවය නිසානේ පස් කපන්නේ. දැන් ගිහින් බලන්න පුළුවන් රබර් වත්තහාරලා පස් කපලා ගස් ටිකක් එල්ලිලා තියනවා. ඔය බිමේ යොවුන් සේනාංකයේ පිට්ටනියකට තමා ඇරලා තියෙන්නේ. වල්වල්වල කොහොමද ග්‍රවුන්ඩ් හදන්නේ. ඇත්තටම මේවා ගැන ටිකක් හොයලා බලන්න ඕනි. පරිසරය විනාශ කළොත් දැන් හෙට අනිද්දා ඉදන් එල්නිනෝ තත්වයක් එක්ක බය හිතනෙවා. මේවා ටික රැකගන්න. මොරගහමඩවත්ත වෙනුවෙන් ෆයිට් කරන්නේ තුඹුල්ලට, කිරිවාමපොලට, හෙට්ටිගෙදර, වේදෙණියට, නවතල්වත්තට කෝම්පිට්ටුව වගේ මැද තියන වතුර උරලා තියන ස්පොන්ච් තමා මේ මොරගහමඩවත්ත. සියලු ම ගොවිතැන් කටයුතුකරන්නේ ඒකෙන්. ඒ ටික හෙට කියන දවසේ නැතිව ගියොත් මොකද වෙන්නේ. අලුත් අයගේ සංකල්පයක් තියනවා වැවක් ඉල්ලලා තියනවා. මන් හිතන්නේ මන්ත්‍රීතුමා සංවර්ධන කටයුතුවලට වැව දාලා තියනවා නේද?ඒ අය වැව හදලා දෙනවා කියලා කියනවා. වැව හදලා දෙනකොට ඉඩමේ පස් ටික කපලා ගස් ටික කපලා අයින් කරාම වැවට වතුර වෙනම අරගෙන පම්ප් කරන්න ඕනිනේ. බැම්ම බැන්දට වැඩක් නැහැනේ. වතුර එන ඉඩම කපලා ඉවර වුණාම වැවටවතුර එන්නේ කොහොමද? මේක බේරලා දෙන්න.සියලු මන්ත්‍රීවරුන්ගෙන් උදව් ඉල්ලනවා ඒ වගේම විල්ගමුවේ පස් කපන එකෙනුත් පරිසර හානියක් වෙන්නේ. මේක වර්තමාන ආණ්ඩුවට ඇත්තටම ලොකු පහරක්. අපි මේවා පෙන්වලා දුන්නාහම ඔබතුමන්ලාගේ යුතුකමක් තමා ඒකට තීරණයක් ඔබතුමන්ලා 13 දෙන වෙනම කතා කරලා හරි කියන්න අපිත් ඒකට උදව් කරන්නම්. අපි මේ පරිසර හානිය වළක්වා ගන්න නැගී සිටිමු. බොහෝම ස්තූතියි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. උද්ධාල අරුණසිරි මැතිතුමා**

ගරු සභාපතිතුමනි, මුලින්ම සුභාශිංසනයක් ගේන්නම් අපි සභාව තියලා ජූනි 12ට අවුරුද්දක් පහු වුණා.ඒ නිසා බොහොම ආඩම්භරයි. අපි සියලු දෙනා එකතු වෙලා ප්‍රජාවගේ වැඩ වෙනුවෙන්, විශාල කැපකිරීමක් කරමින්, ප්‍රශ්න කතා කරමින් ඉදිරියට යනවා.ගරු සභාපතිතුමත් විශාල වෙහෙසක් දරන බව අපි දන්නවා. වැඩ කරගෙන යනකොට වරදින්න පුළුවන්. වැඩියෙන් වැඩක් කරනකොට ප්‍රශ්න ගොඩාක් එනවා. ඒවාට මුහුණ දෙන්න ඕනි. ගරු සභාපතිතුමාගේ මූලිකත්වයෙන් කරගෙන යන සභාවක්. ඉතින් ජනතාවට හානි වෙන, අපේ පරිසරයට හානි වෙන ඉදිරියේදි වෙන කාලගුණික විපර්යාසවලට මුහුණ දෙන්න වෙන මේ වගේ ප්‍රශ්නවලදී කතා කළ යුතුමයි.

විල්ගමුව පස් ප්‍රශ්නය ගැන මම සම්බන්ධීකරණ දෙකක කතා කරා. අපි පහුගිය නිවාස හා ප්‍රජා සංවර්ධන, පරිසර හා පොදු පහසුකම් කාරක සභා අවස්ථාවල පරිසර දිනයට සමගාමීව, පැළ සිටුවන වැඩසටහනක් ගැන සාකච්ඡා කරා. පැළ තැන් තැන්වලා සිටුවනවාට එහා ගිය මේ බල ප්‍රදේශයට සහ

දේශගුණික විපර්යාසවලින් වාසියක වෙන තැනක පැළ සිටවමු කියලා ගරු මොහාන් මන්ත්‍රීතුමාලා ඇතුළු අපි කතා කරා, ඒ අනුව තේක්ක කන්දේ තේක්ක අයින් කරලා කායක් දාලා තියන තැන පැළ සිටුවමු කියලා යෝජනාවක් ගෙනල්ලා, ඊට අදාල ලිපි සකස් කරලා වන අඩවි කාර්යාලයට ගෙනියමු කියලා ලේකම්තුමිය ප්‍රධාන පරිසර විෂය නිලධාරී තුමියව දැනුවත් කරා.විල්ගමුවේ පස් කපපු තැන්වල ගස් සිටුවන්න කියලා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ඉල්ලීමක් තියනවා කියලා වන අඩවි කාර්යාලයෙන් එවලා තිබුණේ. නමුත් මීට වඩා විධිමත් ඵලදායී තැනක් තෝරා ගමු කියලා අපි සාකච්ඡා කරා. මම වන අඩවි නිලධාරීතුමාව මුණ ගැසිලා ඒකේ තියන හෙක්ටයාර් ප්‍රමාණය කීයද? ඒවායේ තියන ඵලදායී ගස් මොනවාද?, ආදායම් ලබන රක්ෂිත වෙනම තියනවා ඒ මොනවාද කියලා ඇහුවා. අපි අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මහජන නියෝජිතයෝ විදිහට, ඔබතුමා රක්ෂිත ආරක්ෂා කරන නිලධාරියා විදිහට අපිට මොකක්ද කරන්න පුළුවන් වෙන්නේ කියලාත් සාකච්ඡා කරා. ඊළඟ පරිසර කමිටුවට එතුමාවත් ගෙන්වමු. සත්තු කැලෙන් එළියට එන්නේ කන්න දෙයක් නැති නිසා අපිට තියන රිලා ප්‍රශ්නෙට පිළිතුරක් විදිහට කොස්, අඹ, දෙල්, කජු, ගොරකා වගේ දේවල් වගා කරන්න තීරණය කරේ. වර්තමාන ආණ්ඩුවේ ක්ලීන් ශ්‍රී ලංකා කියලා හොඳ වැඩ පිළිවෙලකුත් යනවා. ඒ වගේ වැඩපිළිවෙලක් යන වෙලාවක අපි නිහඬව ඉන්න අවශ්‍ය නැහැ. ගරු සභාපතිතුමා ප්‍රමුඛත්වය අරගෙන සියලු දෙනාම මේවාට නැගී සිටිමු.

මේ සභාවට අපි එන්නත් පෙර තුඹුල්ල කන්ද කැපුවා. කාපට් කරපු අපේ ප්‍රාදේශීය සභා පාරෙන් තමා පස් ඇද්දේ. හැබයි මේ කාපට් එක ගැලවිලා ගිහාම අපිට ආයේ හදාගන්න බැරි වෙනවා. අපි ඒකට විරුද්ධ වුණා. අපි එතන කටයුතු කරේ අපේ පාරවල් ටික ආරක්ෂා කරගන්න ඕනි කියන තැන ඉඳලා. ඊට පස්සේ ඒ පස් කැපිල්ල නැවතුණා. අපි ප්‍රාදේශීය සභාවට පිහිටුවලා මාසයකින් විතර හේදිලා ගිය පාරවල් ටිකකට පස් ටිකක් දාන්න තුඹුල්ල කන්දේ ඊට මෙහා ගෙපලක් කපා ගන්න ප්‍රාදේශීය ලේකම්ගෙන් ඇහුවාහම එතුමියගේ නියෝජිතයා විදිහට ග්‍රාම නිලධාරීතුමිය ඒක කපන්න දෙන්න බැහැ කියනවා. ඊයේ පෙරේදා පළාත් නිශ්චිත එකෙන් තුඹුල්ලට ලක්ෂ 15ක පැති බැම්මක් එනවා. මැදගන්ගොඩට. පැති බැම්ම හදලා අවසන් වුණාට පස්සේ පාරයි, වෙලයි අතර ඉඩක් තියනවා. මේ ඉඩ පුරවගන්න තමා ගෙපලක් කපලා පස් ටිකක් පුරවාගන්න හැදුවේ. ප්‍රාදේශීය ලේකම්තුමියගේ නියෝජිතවරිය මේක වානිජමය කටයුත්තක් කියලා අවසර දෙන් නැහැ. මන් කීවා ඔබතුමිය පන්ගොල්ලට එන්න. පන්ගොල්ලේ වත්තක නිසරු පසක් තියෙන්නේ කියලා වැලි අයින් කර ගන්න ලියුමක් දීලා ග්‍රාමනිලධාරීට දිනකට තියන කියුබ් 35 සීමාවෙන් අදිනවා. මන් කීවා නිසරු බිම සරු කරන්න ගන්න පස් අයින් කරනවා නමුත් ඒක අදින්නේ වැලි ප්ලාන්ට් එකකට කියලා. ඒක වානිජමය කටයුත්තක් නෙවේද? කියලා ඇහුවා. ඒනිසා ගරු සභාපතිතුමනි, අපි මේවාට නැගී සිටිමු. 26 දෙනාම යන්න පුළුවන් ඉහළම තැනට යමු. අපි දන්නවා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පස් සම්බන්ධයෙන් පර්මිට් නිකුත් කරන්නේ අනීතිකවයි. ගිය අවුරුද්දේ අගෝස්තු සම්බන්ධීකරණයේදී ඒකාබද්ධ පරීක්ෂණයටකට යමු කියලා කතා කරා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ප්‍රාදේශිය සභාව, පරිසර, භූ විද්‍යා හා පතල් කැනීම්, ගොඩනැගිලි පර්යේෂණ යන ආයතන එකතු වෙලා කතා කරන්න ඕනි.

ගරු සභාපතිතුමා කීවේ ඉල්ලීම කරපු පුද්ගලයෙකුට අවස්ථාව දෙමු කියලා.නමුත් එක පුද්ගලයෙක් විතරයි සභාවේ ඩිපොසිට් කරලා අවසර ගත්තේ. මහරච්චිමුල්ල හන්දියේ ටොන් පහයි යන්න පුළුවන් කියලා ගහලා තියනවා. ඒත් ඒකේ ටෙන් වීල් යන්නේ ඒකට පස් පැටවුවාහම ඒක කියුබ් 4 ½ විතර විතර වෙනවා. එතකොට PRDDඑක නිදිද?ඒගොල්ලෝ පොලීසියට පාස් කරනවා. පොලීසිය අය කියනවා භූ විද්‍යා එකේ අය ඉන්නවාලු කියලා. සභාවක් විදිහට අපි මේකට මැදිහත් වෙමු.අපේ නියෝජතියෙක් නැති වුණත්, වාර ගණනාවක ගල්ගමුවේ ඉන්න අපි මහජන නියොජිතයා විදිහට පත් කරපු කෙනාටත් කීවා මේක පෙළගස්වන්න කියලා.

මම ගරු අරුණ මන්ත්‍රීතුමාටත් ඉල්ලීමක් කරනවා.අධිවේගී මාර්ග හදනවා නම්, මාර්ග සංවර්ධන කටයුතු වෙනවා නම් එතනට අවශ්‍ය කරන හොඳම බොරළු එක තියෙන්නේ විල්ගමුවේ නම් ඒක කපන ක්‍රමයක් තියනවා. කට්ටි ක්‍රමයක් හදන්න ඕනි.  ඒ නිසා ඔය තුඹුල්ල කන්ද කපන වෙලාවේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ඇහුවාහම මේකට අවසර දීලා තියෙන්නේ භූ විද්‍යා එකෙන් කියලා කීවා. ඒකෙන් ඇහුවාහම ඒකාබද්ධ පරීක්ෂණයකින් දුන්නේ කීවා. ඊටපසු අපි පළාත් පරිසර එකට ගියා. මගේ ගමත් කොට්ඨාසයත් නෙවේ. හැබැයි මගේ ගේ ළඟින් යන පාර කැඩුණාහම මට කැක්කුමක් තියනවා. ඊට පස්සේ පරිසර එකෙන් සෙනසුරාදා පරීක්ෂණයට ආවා.

පන්වත්ත වැවේ ජල පෝෂක ප්‍රදේශය තුඹුලු කන්ද, පන්වත්ත වැව, කිරිවම්පොලේ වැව ජල පෝෂක ප්‍රදේශය මොරගහමඩ. ඊළඟට මොරටු කන්ද ගරු නාරද මන්ත්‍රීතුමා සහ කොට්ඨාසයේ මන්ත්‍රීතුමිය විදිහට උප සභාපතිතුමිය දන්නවා ඇති. මොරටු කන්ද කිරිවම්පොලට, තුඹුල්ලට, මඩවලට තියනවා.

අද අක්කර 10 කැලි තුනක් වෙන් කරලා පෞද්ගලික ඉඩම්වලට දීලා. ඇත්තටම ගරු සභාපතිතුමා මේවා ඉතාම අවශ්‍ය කාරණා. මේක කල්ගත් නැතුව ඔබතුමා වැඩසටහනක් හදන්න. අපි ඕනි වෙලාවක පෙළ ගැහෙනවා. ඔබතුමාට යන්න කාලය මදි නම් අපි හරි ලියුම් හදාගෙන යන්නම්, අපිට කතා කරන්න ඇමතිතුමා හරි හම්බෙන්න යන්නම්. මේ ගරු මන්ත්‍රීතුමාලා ගෙනාපු යෝජනාවට අදාලව ඒවැඩේ නවතින් නැත්නම් ජනාධිපතිතුමාගේ ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහනේ ඉන්න ලේකම් දක්වා මේක අරන් යමු. ඒනිසා මේ අපේ පාරවල් ටික පරිසරය, ජල පෝෂක ප්‍රදේශ ටික රැකගන්නත්, ඉදිරියට එන එල්නිනෝ වැනි ආපදාවලින් මිදෙන්නත් අපි ඉක්මන් ක්‍රියාමාර්ගයකට පෙළ ගස්වමු. ප්‍රශ්නය මැරිලා යනකල් ඉන් නැතිව අපි මේකට එකතු වෙලා කටයුතු කරමු. ඒ සඳහා සියලු දෙනාගේම සහයෝගය බලාපොරොත්තු වෙමින් ඉල්ලා සිටිමින් මා නවතිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා**

ගරු සභාපතිතුමනි, ගරු යත්තල්ගොඩ මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාවට ස්තූතිවන්ත වෙනවා. මන් හිතන්නේ එතුමා හැමදාමත් අසාධාරණයක් දුටු තැන නගරයද, තමන්ගේ ගමේද, කොහෙද ඒ වෙනුවෙන් කටයුතු කරන්න එතුමාට අපි නිදහස් පරිසරය ලබා දීලා තියනවා. අසාධාරණය දුටු තැන ඒ සඳහා කටයුත්තට නිරීභීතව පෙළඹිලා තියනවා. මන් හිතන්නේ ගැටලුවක් නැහැ මේ දේවල් නවත්වමුයි කියන තැනක තමා ගරු සභාපතිතුමත් ඉන්නේ. ව්‍යාපෘතියක් කීවාහම, පස් කීවාහම බය වෙනවා. පස් සංවර්ධනයට ඕනි.සංවර්ධනයට ඕනි ක්‍රමවත් විදිහට ඒක නිසි න්‍යාමනයක් යටතේ කරන්න ඕනි.අනවශ්‍ය තැනේ පස් කපනවා නම්, පරිසර හානියක් වෙනවා නම් අපි ඒවාට විරුද්ධ වෙන්න ඕනි. ඒ නිසා මොරගහමඩවත්ත ගැන කතා කරද්දී,එදා තිබ්බ රජයට අපි හිටියත් ඒ යුගයක තමා ඔබතුමා ඇතුළු අපි සියලු දෙනා ගිහින් උද්ඝෝෂණ කරලා ඒකට විරුද්ධව කටයුතු කරලා නවත්තලා තියෙන්නේ. විශේෂයෙන්ම ඔබ තමුන්නාන්සේලා මේවාට විරුද්ධව ආපු රජයක් විදිහට, මේ සම්බන්ධව දැඩිව ක්‍රියාමාර්ගයක් ගත යුතුයි. උදාහරණයක් ගත්තාහම කොහොලානේ රාත්‍රී සමාජ ශාලාව. ඒ කාලයේ කපුවරල කුඩුම්ල්ල ප්‍රදේශය යුධ පිටියක් වෙලා තිබුණේ. ගිහි පිරිසට නායකත්වය දුන්නේ මම, පැවිදි පිරිසට නායකත්වය දුන්නේ පිටවෙල ගුණරතන නායක හාමුදුරුවෝ. භීෂණකාරී තත්වයක් තිබියදී අපි නොබියව ඒ කටයුත්තට නායකත්වය දුන්නා. මම මගේ ප්‍රදේශය වෙනුවෙන් මේ කටයුතුවල නිරත වුණා. අදටත් ඒ ගෞරවය මට තියනවා. ඒ නිසා මම කියන්නේ අපේ රජයක් තුළදී අපි විරුද්ධව කටයුතු කරපු ආකාරයයි. ඒ වගේම වළකුඹුර කපුවරල ගොඩ කරපු ස්ථානයේ රයිස් කොත්තු බස් එක්ක ගෙනත් දාන්න නාමල් මහත්තයාගේ සම්බන්ධීකරණ ලේකම් මට කතා කරනවා.අපේ අහිංසක මිනිසුන්ගේ සිතුම් පැතුම් වෙළඳාම් තියෙන ඒවා නවත්තලා තමා ඔය ස්ථානය රැක ගත්තේ. ඊළඟට මට කතා කරනවා තුෂාර සංජීව නගරාධිපති එයාගේ යාළුවෙකුට ඔය විදිහම එකක් දාන්න. මම කීවා ගරු නගරාධිපතිතුමා අපි සභාවේ තීන්දුවක් අරන් තියෙන්නේ කොට්ඨාසයේ මන්ත්‍රීවරයා විදිහට ඕනි තරම් අහිංසක මිනිස්සුත් ඉන්නවා මෙතන ඔය කටයුත්ත දාන්න. ඒ මිනිස්සුන්ටත් අවස්ථාව නොදී ඔතන රැක ගත්තේ නැත්නම් ඔය වගේ සුන්දර පරිසරයක් අද අපිට ඉතිරි වෙන් නැහැ. ගරු සභාපතිතුමනි, ඡන්දම ගැන හිතලා ඔතන මටත්, ගරු චමින්ද මන්ත්‍රීතුමාටත් රස්සාවක් දෙන්න තිබ්බා. ඒත් අපි නීතියට පිටින් කටයුතු කරේ නැහැ. විශේෂයෙන්ම කින්නරී රාත්‍රී සමාජ ශාලාවේ එවකට හිටිය පොලීසිය අපිට විරුද්ධව හිටියත්, ඉන්න ඉහළ නිලධාරීන් මාව අනවසර ඒකරාශී කිරීම් යටතේ ඇරෙස්ට් කරන්න තමා උත්සාහ කරේ. එවැනි පරිත්‍යාග කරලා තමා යක්කුයි කියන රාජපක්ෂලාට අපි විරුද්ධව කටයුතු කරේ. හැබැයි ඒ මිනිස්සු නීතියෙන් එහාට අඩියක් තිබ්බේ නැහැ. බලපෑම් කරන්න අවේ නැහැ. නිසි ක්‍රමවේදයේ අපි ගිය නිසා ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්න දුන්නා. අද මන් හිතන්නේ, පක්ෂ විපක්ෂ ඔබතුමාගේ සහයෝගයට 25 දෙනෙක් ඉන්නවා. ඒ නිසා මම කියන්නේ ව්‍යාපාර කරන්න ඕනි. ඒවා ක්‍රමවත්ව කරන්න පුළුවන්. පස් කපනවා නම්,ක්‍රමයකට පස් කපන්න පුළුවන්.නමුත් ගරු සභාපතිතුමා චක්‍රලේඛන නිසා මේ මන්ත්‍රීවරුන්ට කතා කරන්න බැරුව අත් පා බැදලා වගේ ඉන්නේ. සභාවේ ගත්ත තීන්දු ඔබතුමා ඉහළට ගෙනියන්න ඕනි මේ මන්තීවරුන්ට සම්බන්ධීකරණයටවත් යන්න නැහැ. පක්ෂ විපක්ෂ කියන එක නෙවේ සියලු දෙනා වැඩ කරන්න ආවේ. මේ යාන්ත්‍රණය හදන්න.ඇත්තටම ගරු අරුණ මන්ත්‍රීතුමාට සම්බන්ධ වෙන්න කියනවා. හැබැයි සභාවෙන් කිසි දෙයක් දෙන් නැහැ. කුණු ගොඩකට අත ගහන්න කතා කරනවා. ලයිට් එකක් දාන්න දෙන් නැහැ, පාර හදන්න දෙන් නැහැ. නමුත් එතුමා ඒ සම්බන්ධව කටයුතු කරයි. ගරු සභාපතිතුමනි, ගරු යත්තල්ගොඩ මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාවට, ඒ ප්‍රදේශයේ මිනිස්සුන්ට සාධාරණයක් ඉෂ්ට කරන්න කියලා මා ඉතාමත් ගෞරවයෙන් ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. නාරද සිරිවර්ධන මැතිතුමා**
ගරු සභාපතිතුමනි, විල්ගමුවවත්ත ප්‍රදේශයේ කීපදෙනෙක්ම මටත් කතා කරලා කීවා මේ ගැන හොයලා බලන්න කිසිම නීතියක් නැතුව, බලපත්‍රයක් නැතුව පස් කපනවා කියලා. රජයේ ඉඩම අක්කර 32 ක් තිබුණා. ඒ ඉඩමේ අද ඒ ප්‍රමාණය ඇත්තෙත් නැහැ. අනිත් කාරණය තමා මේ පස් කපන අය මේවට වැට ගහලා අයිති කරගන්න කටයුතු කරනවා. ඉස්සර පස් කපපු සමහර ඉඩම්වල පොල් පැළ හදලා තියනවා. මේවාට කරන්න දෙයක් නැතුව මිනිස්සු කටපියන් හිටියට මේවාට කැමති නැහැ. අපි දෙගොල්ලෝම පැත්තකට දාලා තමුන්නාන්සේලා ගෙනාවේ මේ රටේ සර්ව සාධාරණව නීතිය ක්‍රියාත්මක වෙයි කියලා. අපේ රජයන් එකක්වත් නැති විදිහට අද වෙන්නේ. අපේ රජයේදී නීතිය ක්‍රියාත්මක වුණා.

එදා මොරගහමඩවත්ත කපන එක සැහෙන කාලයක ඉදන් ආපු එකක්. ඇසෙට් කොම්පැණියෙන් තමා මේක කරන්නේ. ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ බිරිඳගේ ළඟම ඥාතිකම් කියන පුද්ගලයෙක්ගේ කොම්පැණියක්. එහෙම වෙලත්, ඒ රජයට පස් කපන වැඩේ කරගන්න අපි දුන්නේ නැහැ. විශේෂයෙන්ම සන්ධ්‍යා හිටපු ගරු සභාපතිතුමාගේ කාලයේත්, හිටපු ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනියගේ කාලයේත් අවස්ථාව දුන්නේ නැහැ. මේ කන්ද කපන්න දීර්ඝ කාලයක් උත්සාහ කරා. මෙතන භයානකකම පස් කපන් එක නෙවේ. මෙතන පස්වලට වඩා වැඩි වටිනාකමක් වැලිවලට තියනවා. මේක සරුසාර පොල් ඉඩමක්. මේ වගේ ක්‍රියා කිසිසේත්ම අනුමත කරන් නැහැ. මොකද පරිසර හානි, අනිත් පැත්තෙන් කිරිවම්පොළේ වැව තියනවා, අනිත් පැත්තෙන් කිරිවම්පොළේ ලොකු වතුර බුබුලක් තියනවා. වර්ෂාව නැතත් ඒ වෙල් යාය හැමදාම සක්‍රීයව වැඩ කරන්න පුළුවන් ජල මූලාශ්‍රයක් තමා මේ ප්‍රදේශය. මේ සියලු දේවල් නිසා එදා අපි උද්ඝෝෂණය කරලා නවත්තලා දාන්න හැකි වුණා. පසුගිය රජයන්වල නීතිය ක්‍රියාත්මක වුණා. අපිට පේන විදිහට මේ රජයෙන් නීතියක් ක්‍රියාක්මක වෙන් නැහැ. ප්‍රාදේශීය සභා අනුමැතිය නැතිව මේවා කරන්න බැහැ. නැබඩවතුර ප්‍රදේශයේත් පස් කන්දක් කපන්න ගිහිල්ලා ඒත් කරන්න දුන් නැහැ. අද මන් හිතන්නේ මුලින්ම රජයේ නිලධාරීන්ට ටික භය කරලා තමා මේ වැඩ කටයුතු ටික කරන්නේ. අතේ තියන බල නහර කපනවා, එල්ලිලා මැරෙන්න මානසිකත්වය හදනවා මේ තත්තවයත් එක්ක රජයේ නිලධාරීන් මේවාට විරුද්ධ වෙන්න භයයිද කියලා අපිට හිතෙනවා. ප්‍රාදේශීය ලේකම්තුමියට මේවා නවත්වන්න සම්පූර්ණ බලය තියනවානේ. මමත් දහපාරකට වැඩිය කෝල් දුන්නා හරි හරි මන්ත්‍රීතුමා කියනවා නමුත් අද වෙනකල් මේවා නැවතිලා නැහැ.

දැන් ගරු උද්ධාල මන්ත්‍රීතුමා මෙතුමා යෝජනාව ඉදිරිපත්කිරීම සම්බන්ධව ස්තුතිවන්ත වෙනවා. ඔබතුමාලා කරන්න ඕනි වැඩක්නේ ගරු සමන්ත මන්ත්‍රීතුමා කරේ. ආණ්ඩුපක්ෂය හැටියට අපිට පෙර තමුන්නාන්සේලා ක්‍රියාත්මක වෙන්න ඕනි. මෙහෙම නීතියක් ක්‍රියාත්මක නොවෙන රටක කොහොමද අපි ජීවත් වෙන්නේ. 76 අවුරුද්දක් මේ රට පාලනය කරපු මිනිස්සුන්ට බැන බැන ඉන්නවා. අවුරුදු දෙකක් තිස්සේ රට කරන දිහා බලලා අපිට සතුටු වෙන්න හැකියාවක් නැහැ. රට ගැන ලොකු කණගාටුවක් දුකක් තමා ඇති වෙලා තියෙන්නේ. ඒ නිසා ගරු සභාපතිතුමා මේකට මූලිකත්වය අරන් අපි එකතු වෙලා උද්ඝෝෂණයක් හරි කරලා කටයුතු කරමු. විශේෂයෙන්ම මොරගහමඩවත්තේ පස් කපන එක නවත්තන්නම ඕනි. එදා රජයන් මේවා නවත්වගෙන ආවා. එදා ඒ වැඩේ වැරදි නම්, අද හරියන්නේ කොහොමද ? මේවා නවත්වන්න.ආයේ තමුන්නාන්සේලා බලයට එන්න හිතේ තියේනම්, තමුන්නාන්සේලා කියපු දේවල් ඉෂ්ට කරන්න කියලා මා මේ අවස්ථාවේ ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ගරු යත්තල්ගොඩ මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව මම මීට මාස හයකට පෙර ගේන්න ඕනි යෝජනාවක්. අද වන විට විල්ගමුවේ වලවල් 4ක් කපනවා. ගරු නාරද මන්ත්‍රීතුමා කීවාට පසුව මම හොයන්න ගත්තේ. රජයේ ඉඩම කපනවා. රජයට අයිති රබර් වත්ත කපලා ලෝඩ් ගාණක් පටවලා විකුණනවා. සහකාර ලේකම්ට මම දුරකථනයෙන් කියනවා මෙහෙම ගස් කපලා රබර් කොට පටවලා තියනවා කියලා. මේකේ වීඩියෝ එක මා ගාව තියනවා. ගරු සභාපතිතුමා, ගරු මන්ත්‍රීතුමා, මේවා විපක්ෂයේ කෙනෙක් කියන කතා කියලා බැහැර කළොත් මේවායේ ප්‍රතිඵලය අවුරුදු දෙකකින් අතිශය භයානක විදිහට එනවා. මෙහෙම අපේ ආණ්ඩුවල පස් කැපුවේ ඒජී පර්මිට් දාලා කියුබ් තුනේ ලොරිවලින් පස් කියුබ් එක ඇද්දේ. හැබැයි පර්මිට් නොදා කැපුවේ නැහැ. දැන් අද RDA එකට සල්ලි ගෙවලා නැහැ. කිලෝ මීටරයකට ලක්ෂ තුනයි ගාණක් ගෙවන්න ඕනි. ගෙවලා නැහැ. කිසිම ආයතන නිර්දේශයක් අරගෙන නැහැ. ගොඩනැගිලි පර්යේෂණ එකට ලක්ෂ එක හමාරක් ගෙවන්න ඕනි. ඒවා ගෙවලා නැහැ. එතකොට ට්‍රාන්ස් පෝර්ට් පර්මිට් නැහැ. සමහර පර්මිට් කූට ලේඛන ඒවා හොරට හදපුවා. රාජ්‍ය භාගය අය කරන් නැහැ.

මේ සිද්ධිවලට අලව්ව සහ බෝයවලාන පොලීසිය, භූ විද්‍යා එක, කොළඹ භූ විද්‍යා අධ්‍යක්ෂක ජනරාල් එකේ වැටලීම් අංශය වගකියන්න ඕනි. ගරු සභාපතිතුමනි, ඔබතුමාලා මෙතනදී නිහඬ වීම ගැන කණගාටු වෙනවා. ගරු සභාපතිතුමනි, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාට මේ ගැන අවධානය යොමු කරන්න කියන්න. මේ යන තත්වය උඩ මේකත් සෝම කුමාර ඩයස් කැපුවේ කීවොත් මොකද කරන්නේ? ඒ නිසා ගරු සභාපතිතුමා, ගරු මන්ත්‍රීතුමන්ලා පැහැදිලිව මේ කාරණාව සම්බන්ධයෙන් අධීක්ෂණය කරන්න. මේ සම්බන්ධව දන් නැහැ කියලා ප්‍රාදේශීය ලේකම්ට ඇඟ බේරගන්න බැහැ. ප්‍රාදේශීය ලේකම්තුමිය හරියට ග්‍රාම නිලධාරිට වගකීම පැවරුවා නම්, මේ පස් කැපිල්ල කොහෙවත් වෙන්නේ නැහැ.

මේ බල ප්‍රදේශය තුළ ඍජු ඉදිකිරීම් කැණීම් සම්බන්ධව එනවා නම්, එකේ බලපත්‍රය දීලා පර්මිට් එක දවස් තුනකින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට එනවා. ඒ බලපත්‍රය එනකොට ඒකට පර්මිට් තිබ්ලාද නැද්ද පස් කපන්නේ කියලා එම වසමේ ග්‍රාම නිලධාරී දන්නවා. ඔය කැපීම දවස් 18ක්. ගරු සභාපතිතුමා, ඒ පර්මිට් එකේ බලපත්‍රය ලබා දුන් කාලය සහ අවලංගු වන කාලය, කියුබ් කීයේ ධාරිතාවයෙන්ද අදින්නේ කියලා තියනවා. මොන ඉඩමද කපන්නේ කියලා ජී.පී.එස්. අංක තියනවා. ඒ ඔක්කෝම තියාගෙන දැන් ග්‍රාම නිලධාරී දන් නැහැ වගේ ඉන්නවා. දවස් 18 ක් විල්ගමුවේ පස් කැපීම දන් නැත්නම් ග්‍රාම නිලධාරී තමන්ගේ කාර්යාලයට ගියේ නැද්ද? ප්‍රාදේශීය ලේකම්තුමිය ග්‍රාම නිලධාරීට හරියට නියෝග ටික නිකුත් කරා නම්, මේ බල ප්‍රදේශයේ එක් කෙනෙකුටවත් පස් කපන්න බැහැ. භූ විද්‍යා එකටවත් මොනවත් කරන්න බැහැ. ග්‍රාම නිලධාරීට වගකීම දුන්නා නම්, මෙතන පස් කපනවා කියලා ප්‍රාදේශීය ලේකම්ට වාර්තා කරනවා. නමුත් යම් ක්‍රියාවලියක් සම්බන්ධව ඔබගේ ආණ්ඩුව සහ ඔබ මහාහරිමින් සිටනවා නම් ඒක අපිට සැක සහිත තැනක් වෙනවා. ඔබ හොරු නෙවේනේ. ආණ්ඩු පක්ෂයේ අය පීඩනයකට ලක් වෙලා ඉන්නවාද? ඇයි ඔබට කතා කරන්න බැරි. විල්ගමුව ප්‍රශ්නය විතරක් නෙවේ. අසාධාරණයට කතා කරන්න බැරි ඇයි? පොලීසියට, ප්‍රාදේශීය ලේකම්ට, භූ විද්‍යා, පරිසර එකට, එස්.ටී.එෆ්. එකට, කුරුණෑගල වැටලීම් එකට භය නැතුව මෙහෙම කරනවා නම් ඔබට අවිය පෙන්වීම එතරම් දෙයක් නෙවේ. අපේ සභාවත් හැම පස් කපන එකකම නිර්දේශය දෙන්න ඉන්නවා. ඒ නිසා අපේ වෙළඳ බලපත්‍රය ගන්නවාද නැද්ද බලන්න. වෙළඳ බලපත්‍රය අරන් නැහැ කියලා තහනම් කරන්න සභාපතිවරයාට බලතල තියනවා. මැර බලයට, බලහත්කාරකමට ඉඩ තියන්න එපා. පර්මිට් දාලා බලපත්‍ර සහිතව නියම ක්‍රමවේදයකට පස් කපන්න ඕනි.

තව විශේෂ දෙයක් තියනවා ගරු සභාපතිතුමනි, ප්‍රාදේශීය ලේකම්ගේ සහ ඉඩම් කොමසාරිස්ගේ අවසරය ඇතිව මම මැනපු විල්ගමුවේ අක්කර හතේ ඉඩමට, ප්‍රාදේශීය ලේකම්ගේවත්, කාගේවත් අවසරයක් නැතුව භූ විද්‍යා එක වෙන කාගෙවත් නමකින් සල්ලි භාර ගන්නවා. කොහේ තියන නීතිද කියන්නකෝ. ප්‍රාදේශීය ලේකම්ගේ ඉඩමකට සල්ලි බඳින්න ප්‍රාදේශීය ලේකම්ගේ අවසර ඕනිනේ. මේ බල ප්‍රදේශයේ ප්‍රධාන පුරවැසියායා හදන පාරකට සල්ලි භාර ගන්න ප්‍රාදේශීය ලේකම්ගේ ලියුම නැතිව දෙන් නැහැ. හැබැයි දැන් මම පෙන්වන්නම්, මගේ ඉඩමේ ඉස්සරහා මැනපු අක්කර දෙකකට, ප්‍රාදේශීය ලේකම්ගේ ලියුම නැතුව වෙන කනෙක් සල්ලි බඳිනවා. මේවා සිදු විය යුතු දේවල්ද? කල්පනා කරන්න. මේ යන්නේ භයානක තැනකටයි. මේවාට මෙතුමාලත් වගකියන්න ඕනි. 2015 තීන්දුව අරන් අවසන් කරා නම්, මෙහෙම දේවල් වෙන් නැහැ. ග්‍රවුන්ඩ් එක ලෙවල් එකට තියෙන්න ඕනි නිසා පුද්ගලිකව ලක්ෂ ගාණක් මුදල් වියදම් කරලා මුදුහු මට්ටම් අරගෙන ඒ කටයුත්ත සිදු කරා. රජයේ ව්‍යාපෘතියක් යටතේ මට ග්‍රවුන්ඩ් එක හදන්න තියෙද්දී ඉතිරි ටික පොදු කටයුතු සඳහා යොදා ගන්නවා. නමුත් ග්‍රවුන්ඩ් එක ලෙවල් එකට තියෙන්න ඕනිනේ. මෙහෙම තියෙද්දී ග්‍රවුන්ඩ් හදලා වැඩක් තියේද? දැන් මේ කපන ඒවාට ලෙවල් තියනවාද? ප්‍රාදේශීය ලේකම් මේ මට්ටමේ මට ඉන්න කියනවා.

ඒ නිසා ගරු සභාපතිතුමනි, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, අලව්ව පොලීසිය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, බෝයවලාන පොලිසීය, ගොඩනැගිලි පර්යේෂණ ආයතනය, භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යංශයේ කුරුණෑගල සහ කොළඹ අධ්‍යක්ෂක ජනරාල් තුමා වෙත, කර්මාන්ත ඇමතිතුමාට, කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්තුමාට, PRDD, RDA, පළාත් පරිසර අධිකාරිය, පළාත් ඉඩම් යන ආයතන ටික හරහා ඉහළටම දැනුවත් කරලා විශේෂ කාර්ය බලකායටත් අවශ්‍ය නම් මේ කරුණු කාරණා පැහැදිලිව සඳහන් කරලා තැපැලට යොමු කරන්න කියන ගෞරවනීය ඉල්ලීම මා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්. ප්‍රියන්ත උපුල් කුමාර කරුණාරත්න මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ගරු සමන්ත යත්තල්ගොඩ මැතිතුමා ගෙනාපු යෝජනාවට ආණ්ඩු පක්ෂයේ සියලු දෙනා සහාය දෙනවා කියලා මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා.

පරිසරය විනාශ කරන එකට පැහැදිලිවම අපි සියලු දෙනා විරුද්ධයි. පරිසරය සමඟ කටයුතු කිරීමේදී ඉතා සංවේදීව කටයුතු කළ යුතුයි.

ගරු චමින්ද වර්ණසූරිය මන්ත්‍රීතුමා කියන තැනට මමත්, ගරු උප සභාපතිතුමියත් දිට්වා එකට පස් කපන නිසා ගියා. එතන කන්දක් කපලා පල්ලමක් තියෙන්නේ. එතන ග්‍රවුන්ඩ් එකක් හදන්න ක්‍රමයක් නහැ. පෙර කපපු ක්‍රමයට අපි කපන්න දෙන් නැහැ,ඒ වගේම පරිසර හානියට තුඩු දෙන දේවල්වලට අවසර දෙන් නැහැ කියලා රජයක් විදිහට, ප්‍රතිපත්තිමය තීරණයක් තියනවා. මේකේදී පොඩි ගැටලුවක් තියනවා. එකක් තමා ප්‍රාදේශීය ලේකම්තුමියගේ ක්‍රියාකලාපය මම දැඩිව විවේචනය කරනවා. හේතුව තමා දිට්වා ආපදා වෙලාවේ ප්‍රාදේශීය සභාවේ ගම්මවල හානි වුණ පාරවල් ප්‍රතිසංස්කරණය කරන්න බොරළු කපා ගන්න ගිහිල්ලා ප්‍රාදේශීය සභාවේ අපි සැහෙන වෙහෙසක් දැරුවා. පස් කියුබ් 1000ක් අපිට අනුමත වෙලා තියනවා තව 500ක් අපිට කපන්න තියනවා. ඒ ඉතිරි 500 කපන්න දැන් අවසරය දෙන් නැහැ. හැබැයි එතුමිය පෞද්ගලික කට්ටියට පස් කපන්න අනුමැතිය දීලා තියනවා. මේ සම්බන්ධව අපි අනිවාර්යෙන් කතිකාවතක් ගොඩ නගන්න ඕනි. මේක අපි ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමත් එක්ක කතා කරලා ක්‍රමවේදයක් සකස් කරනවා.අපි බලයට එන්නේ මේ අනීතික දේවල් කරන්න දෙන් නැහැ කියලා. ඒ වගේම ඒදේවල් කරන්න දිය යුතුත් නැහැ කියන ස්ථාවරයේ මන්ත්‍රීවරු විදිහට අපි ඉන්නවා. ඒවගේ අනීතික වැඩක් වෙනවා නම් ඊට විරුද්ධව අපි පෙනී සිටිනවා. ඒක ආණ්ඩු පක්ෂයේද, විපක්ෂයේ කෙනෙක්ද නැත්නම් අපිට සහයෝගය දීපු කෙනෙක්ද කියන එක අපිට අදාල නැහැ. මොකද අපි රැක ගත යුත්තේ අපේ ගම, අපේ පරිසරය සහ අපේ ප්‍රදේශය. ඒ ප්‍රදේශයට හානි වෙන ඕනි දෙයක් වෙනවා නම්, ඊට විරුද්ධව අපි අනිවාර්යෙන් නැගී සිටිනවා. ගරු චමින්ද වර්ණසූරිය මන්ත්‍රීතුමනි, ඔබ ප්‍රකාශ කරපු දේවල් ඔබතුමාට හැකියාවක් තියේ නම් අපිට ලිඛිතව දෙන්න. ගරු අශෝක ගුණසේන මැතිතුමත් එක්ක එකතු වෙලා අපි මේ සම්බන්ධව අනිවාර්යෙන් කටයුතු කරනවා.

ගරු චමින්ද වර්ණසූරිය මන්ත්‍රීතුමත් දන්නවා. මේ ඊයේ පෙරේදා වඩුවාවේ රක්ෂිතය පත්තිනි දේවාලයට අයිතියි කියලා අක්කර 125 ක් පෞද්ගලික අංශයට නිළමේතුමා විකුණනවා. ඒකට විරුද්ධව අපි මහජන පෙත්සමක් ගොනු කරලා ගරු ජනාධිපතිතුමාට යැව්වාට පස්සේ ගිය සතියේ විභාගය ගත්තා. මාත්,ගරු අශෝක මන්ත්‍රීතුමත්, පත්තිනි දේවාලයේ බස්නායක නිළමේ තුමත්, ඒ ඉඩම ගත්ත පාර්ෂවයත්, ගමේ තුන් හතර දෙනෙක් එක්ක ගිහිල්ලා එකට වාඩි වෙලා කතා කරා. ඒ අවස්ථාවේ මහජන අධ්‍යක්ෂක ජනරාල් තුමා කීවේ මේක එහෙම අයිති වෙන්න දෙන් නැහැ. පත්තිනි දේවාලයට අයිති වුණත් පරිසර හානියක් වෙනවා නම්, ගම් වැසියන්ට හානියක් වෙනවා නම් කිසිසේත් මේකට අපි ඉඩ දෙන් නැහැ කියන මතයේ අපි ඉන්නවා කියලා. ඒක බලන්න මේ 21 වන දින මහජන අධ්‍යක්ෂක තුමාත්, බෞද්ධ කටයුතු කොමසාරිස්තුමාත්, බස්නායක නිළමේ තුමාත් වඩුවාවට එනවා. ඉතින් අපි ඒ අසාධාරණ දේවල්වලට ඍජුව මැදිහත් වෙලා කටයුතු කරනවා.

අපි විල්ගමුව වත්ත ප්‍රශ්නෙත් මම ඇස් දෙකෙන් දැක්කා. ලොකු පරිසර හානියක්. ඒක විතරක් නෙවේ ගරු සමන්ත යත්තල්ගොඩ මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාවත් පෞද්ගලික සුඛ විහරණය උදෙසා කරන පරිසර හානියට මන්ත්‍රී කණ්ඩායමක් විදිහට අපි ඉඩ දිය යුතු නැහැ. ඊට විරුද්ධව අපි අනිවාර්යෙන් නැගී සිටිය යුතුයි. අපි කීවා වගේම අනිවාර්යෙන් ඒ දේ කරනවා. අපි රටක සංවර්ධන කටයුතු සිදු කළ යුතුයි. හැබැයි සංවර්ධන කටයුතු මුවාවෙන් ජාවාරමක් කරනවා නම්, ඒකට අපි එරෙහි විය යුතුයි. ඒ වගේම තමා සංවර්ධන කටයුතු කරනවා නම්, ඊට අදාල පස් හරි, ගල් හරි ගන්නවා නම් ඒක පරිසරයට හානියක් නොවන අවම හානියක් වෙන විදිහට හරි ගන්න ඕනි. මොකද පරිසරයට හානියක් නොවෙන විදිහටම ගන්න බැහැ.පරිසරයේ සම්පත් ගන්නකොට පරිසරයට අවම හානියක් වෙන විදිහට ඒ දේ ගන්න ඕනි. සංවර්ධනය කරනවා කියලා හයිවේ හෝ මොනවා හැදුවත් අපේ පරිසර පද්ධතිය විනාශ වෙනවා නම්, ඉදිරියේදී එන එල්නිනෝ තත්වයන්ට එහෙම මුහුණ දෙන්න බැරුව යනවා. ඒක නිසා අපි හැමවෙලාවේම පරිසරයත් එක්ක ගණුදෙනු කිරීමේදී සංවේදී වෙන්න ඕනි.එහෙම නැති වුණොත් බොහෝ අවාසනාවන්ත සිදුවීම්වලට මුහුණ දෙන්න සිදුවෙනවා. දිට්වා අවස්ථාවේ ලංකාව විශාල හානියකට මුහුණ දුන්නා. ඒවත් තාම යථාවත් කරමින් පවතිනවා. ඒක නිසා නැවත අපේ රට ඒවගේ තත්වයකට ගෙනියන්න අවස්ථාව තියන් නැහැ. පරිසර හානි වෙනවා නම් ඒවාට මැදිහත් වෙනවා. ඒවා වළක්වනවා. අපි නිහඬව හිටියේ නැහැ. හරියට අපි ඒ විස්තර ටික දැනගන්න ඕනි. අපි ඒවාට ක්‍රියාමාර්ග ගන්නවා. ඒවාගේ අසාධාරණ දේවල්වලට අපි කිසිසේත් නිහඬව ඉන්නැහැ. ඊට එරෙහිව අපි නැගී සිටිනවා.

ඒ වගේම අපේ ජනාධිපතිතුමා කරපු දේවල් ටිකකුත් මේ අවස්ථාවේ මතක් කරන්නම්. ක්‍රිකට් පරිපාලන මණ්ඩලය විසරුවා ගන්න බැරුව ක්‍රිකට් පරිපාලනයේ ලොකු ප්‍රශ්නයක් තිබුණා.

හැබැයි අද අපි ඒක කරලා තියනවා. අතුරු කමිටුවක් පත් කරලා තියනවා. ඒවගේම තමා රුපියල් මිලියන 3103ක් වියදම් කරලා හෘද කැතිටර් යන්ත්‍ර 16 ක් රෝහල් පද්ධතියට ගේනවා. රෝහල් පද්ධතිය සංවර්ධනය කරන්න යන්ත්‍ර දෙනවා. ඒ වගේම ලක්ෂ 500ක් වියදම් කරලා ලියුකේමියාව, තැලිසීමියාව ඒ වගේම රුධිර පිළිකා සම්බන්ධව රෝග නිශ්චය කරන මැෂින් රෝහල්වලට ගෙනත් දෙනවා. ඒවගේම කාන්තාවන්ගේ පියුයුරු පිළිකා පෙර හඳුනා ගැනීමේ යන්ත්‍ර 07 ක් රෝහල් පද්ධතියට අපි එකතු කරනවා. ඩී.එස්.එස් විදුලි පද්ධතියට පුනර්ජනීය විදුලි බලය වැඩි දියුණු කිරීම සඳහා මෙගා වොට් 150 ක ධාරිතාවයකින් යුතු බැටරි පද්ධතියක් මේ වෙනකොට ගෙනල්ලා ඒකේ කටයුතු ඉදිරියට කරගෙන යනවා. ඒ වගේම තමා සුළං බලාගාරය ඒකට අවශ්‍ය උපකරණ ලංකාවට මේ වෙනකොට ගෙනල්ලා තියනවා. ඒකට දේශීය ආයෝජකයෙක්ම තෝරගෙන තියනවා. 2019 වසරේ මාතර ප්‍රදේශයේ ලවන බාධක නිසා වගා හානි සිදුවන මිනිසුන්ට අපේ ආණ්ඩුවෙන් තමා වන්දි දෙන්න පටන් ගත්තේ. සංවර්ධනය පැත්තෙන් ගත්තොත් රඹුක්කන ගලගෙදර අධිවේගී මාර්ගය ඉදිරි කොටස කිසිම විදේශ ණය මුදලක් නොගෙන රුපියල් මිලියන 112කින් දේශීය කොන්ත්‍රාත්කරුවන් හරහා වැඩ පටන් අරන් තියනවා. හැබැයි කිසිම ණය මුදලක් ගත් නැහැ. දිට්වා ආපදා තත්වය යටතේ ආධාර දීලා තියනවා. මගේ කොට්ඨාසයේ ආපදා වූවන්ට නිවාස අහිමි වූවන්ට ඇරෙන්න පක්ෂ භේදයකින් තොරව ආධාර දීලා තියනවා. කිසිම පක්ෂ භේදයක් නැහැ සහන දෙන පුළුවන් අයට සහන දෙනවා.

ගරු සභාපතිතුමනි, අපිට ප්‍රදේශයක් වශයෙන් තියන ලොකුම හානිය තමා මේ පස් ජාවාරම. මේ පස් ජාවාරම අනීතිකව කරනවා නම් ඒකට මැදිහත් වෙන්න ඕනි. නීතියට අනුව කරත් ඒක පරිසර හානියක් වෙනවා නම්, අපි ඒකට විරුද්ධව කටයුතු කරන්න ඕනි කියන ප්‍රකාශය කරමින් ගරු යත්තල්ගොඩ මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාවටත්, ඒ වගේම විල්ගමුවවත්ත ප්‍රශ්නයටත් අපි සෘජුව මැදිහත් වෙලා අනිවාර්යෙන්ම මේ වෙනුවෙන් පෙනී සිටිමුයි කියලා ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමනි, අඩු වැඩි වශයෙන් නිදහස් අධ්‍යාපනයෙන් පෝෂණය වුණ, රජයේ රෝහලින් බෙත් ගත්ත පුරවැසියෝ හැටියට ලංකාවේ 76 අවුරුද්දක් තුළ මේ රට පාලනය කරපු සෑම රාජ්‍ය නායකයෙක්ම මේ රටට කරන්න ඕනි දේවල් කරා. ගරු සභාපතිතුමනි, 2015 විෂය භාර ඇමතිවරයා ලෙස කටයුතු කරේ ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා අධිවේගී මාර්ග වැඩසටහන පටන් ගන්නවා. ඒ ඒ ආසනවලින් අධිවේගී මාර්ගවලට සහයෝගය දෙන්න විරුද්ධ වෙන්න එපා, දඹදෙණි ආසනයෙන් අධිවේගී මාර්ගය ඇතුල් වෙලා, දඹදෙණි ආසනයෙන් එළියට යනතෙක් ඒකට අවශ්‍ය ගල්,වැලි සහ බොරළු ඒ කට්ටියට ලබා දෙන්න කියලා ඇමතිතුමා කීවා. එදා ඉඩම් හිමියන්ටරු.500.00ක් දීලා තමා කපාගෙන ගියේ. නමුත් ඉඩම් හිමියන්ට සාධාරණ මිලක් තීරණය කරන්න කියන්න අඩු මුදලට දෙන්න යන්න එපා මොකද මේකෙන් ව්‍යාපාරිකයන් තමා මේකෙන් ප්‍රයෝජනය ගන්නේ කියලා ඇමතිතුමා කීවා අවසානයේ රු. 1500.00 ක් විතර තීන්දුව ආවා. නමුත් ආසන ඇතුළේ වැඩ ඉවර උනාම අපි තීන්දුවක් ගන්නවා කීවා. ඒක සභාවෙන් ගන්න කීවා.

ඊළඟට තුඹුල්ලේ බොරළු කපන්න සභාවෙන් අවසර ඉල්ලලා අවසරය දුන්නා. අපිට ප්‍රශ්නයක් තිබුණා අපි ප්‍රශ්නය ඇද්දා. දඹදෙණි ආසනයේ සියලු සංවර්ධන කටයුතු අවසන්ව ඇති බැවින් අලව්ව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය තුළ ප්‍රාදේශීය සභා, PRDD හෝ RDA හැර වෙනත් කටයුතු සඳහා බොරළු කැපීමට අවසර නොදී සිටීමට සියලු මන්ත්‍රීවරුන්ගේ ඒකච්ඡන්දයෙන් ඒ යෝජනාව සම්මත වුණා. ඒ කාලයේ ගංවතුරක් ඇවිල්ලා පාරවල් කැඩිලා මම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ එවකට හිටිය ප්‍රාදේශීය ලේකම්ගෙන් “දිසාපතිතුමා මොකද දැන් තත්වය කියලා” ඇහුවාම “අනේ මන්ත්‍රීතුමා සභාපතිතුමාට කියන්න ඕනි තැනකින් කපලා දාන්න මේ පාරවල් ටික හදන්න එපැයි තමුන්නාන්සේලා හදන්න ඕනිනේ” කියලා කීවා. වසම්වල නිලධාරීන්ට කතා කරලා කීවා වහාම ඉඩම් හිමියන්ගේ අවසරය මත සභාපතිතුමාගේ වාහන දාලා ඕනි තැනකින් කපන්න අවස්ථාව දෙන්න කියලා. මේ දක්ෂ නිලධාරීන්. එහෙමයි ප්‍රාදේශීය ලේකම්වරු සභාවත් එක්ක සහෝදරවත්වයෙන් වැඩ කරේ.

ඔබතුමාලා එකට එකතු වෙලා ගරු අශෝක මැතිතුමාට කතා කරන්න. කිසිම අවසරයකින් තොරව විල්ගමුවේ හැමතැනම බොරළු කපනවා. හැබැයි නීත්‍යානුකූලව සියලු ලියකියවිලි සකස් කරලා අවසානයේ වැඬේ කරන තැනට ගෙනාවාහම ඒ පුද්ගලයාට කරන්න දෙන්නෙත් නැහැ. ඒකට තවත් එකක් එකතු කරනවා. ඒ නිසා අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපි ලැජ්ජා වෙන්න ඕනි මේ සභාවේ පාරවල් ටික ගංවතුරට කැඩිලා යනවා.

ඒක හදාගන්න ගරු සභාපතිතුමා බොරළු ටික කපා ගන්න ගිහාම ප්‍රාදේශීය ලේකම් බොරළු ටික කපා ගන්න දෙන් නැහැ. පාරවල් කැඩිච්ච මිනිස්සු සභාවට කතා කරන්නේ. මුලින්ම මුදල් ගෙවන්න කියනවා. ඉස්සර සහෝදර රාජ්‍ය ආයතනවලට රාජ්‍ය භාරය ගෙව්වේ නැහැ. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ වෙලාවේ වසමේ ග්‍රාම සේවක මම නම් ප්‍රාදේශීය ලේකම් හැටියට දැන ගන්න ඕනි වසමේ අහවල් ස්ථාවල බොරළු කැපෙනවා තමුන් මාව දැනුවත් කරාද කියලා අහන්න. නැහැ. ඒකට අදාල විනය ක්‍රියාමාර්ග ගන්න ඕනි. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේවා සම්බන්ධීකරණයේ දී කතා කරලා ගරු අශෝක ගුණසේන මැතිතුමාට කතා කරලා DC යොමු කරමුයි කියලා යෝජනා කරමින් මා නිහඬ වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. නාරද සිරිවර්ධන මැතිතුමා**
ගරු සභාපතිතුමනි, මේ මොරගහමඩවත්ත, විල්ගමුවවත්ත ප්‍රශ්නය දිගෙට ඇදෙන ප්‍රශ්නයක් සියලු දෙනා එකතු වෙලා ප්‍රාදේශීය ලේකම් තුමිය ළඟට යමු. මේ සම්බන්ධව කියමු.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීවරුනි, අපි සියලු දෙනා මේ සම්බන්ධව සාකච්ඡා කරලා ඒ මැදිහත් වීම කරමු. පස් කපන එක සම්බන්ධව ආරංචි වුණා. ඊට පස්සේ දුරකථන අංකය හොයාගෙන හෙට උදේට නලින් කියන පුද්ගලයාට කතා කරලා සභාවට එන්න කීවා. මොකද අනිත් පුද්ගලයෝ සල්ලි ගෙවලා කරනවා එතකොට තව කෙනෙකට නිකන් යන්න බැහැනේ.එයා ආවේ නැත්නම් එයා හොයන්න හරි යනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්. සුසිල් ප්‍රේමසිංහ මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඔය සම්බන්ධව දැනුම් දීමක් කරන්න තියනවා. එකක් තමා කිරිවානාපොල වසමේ පස් කපන්න ගිහිල්ලා විරෝධතාවයක් ගොඩ නැගුවා. ඒකත් එක්ක භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යංශයෙන් ඇවිල්ලා ඒ ලයිෂන් එක ආපහු ගත්තා. දෙවනි කාරණය අනිත් ස්ථාන මේ වෙනකොට උදේ 9.00 ඉදලා ගරු අශෝක සහෝදරයා සහ තවත් කණ්ඩායමක් ඒ සම්බන්ධව ගත යුතු තීරණ මොනවාද කියන එක සම්බන්ධයෙන් නිරීක්ෂණයක යෙදී සිටිනවා. ස්තූතියි.

ඒ අනුව, අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මෙරගහමඩවත්ත සහ විල්ගමුව වසමේ සිදුවන අත්තනෝමතික ක්‍රියාවලිය හා විනාශය සම්බන්ධව රජයේ ආයතන දැනුවත් කරමින් නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීම සඳහා ලිපි මඟින් දැනුවත් කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**<u>06.කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම</u>**

**(6.1) <u>2026.06.02 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීම් වාර්තාව</u>**

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
2026.06.02 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීම් වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, 2026.06.02 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීම් වාර්තාව අනුමත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එම්.ඒ. චන්දිමා ලක්මාලි මල්ලව ආරච්චි මැතිනිය**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, 2026.06.02 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**(6.2) <u>2026.06.02 දින පැවති පරිසර හා පොදු පහසුකම් කාරක සභා රැස්වීම් වාර්තාව</u>**

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
2026.06.02 දින පැවති පරිසර හා පොදු පහසුකම් කාරක සභා රැස්වීම් වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, 2026.06.02 දින පැවති පරිසර හා පොදු පහසුකම් කාරක සභා රැස්වීම් වාර්තාව අනුමත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එම්.ජේ. චන්දිමා ලක්මාලි මල්ලව ආරච්චි මැතිනිය**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, 2026.06.02දින පැවති පරිසර හා පොදු පහසුකම් කාරක සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

## (6.3) 2026.06.03 දින පැවති කාර්මික සේවා කාරක සභා රැස්වීම් වාර්තාව

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
2026.06.03 දින පැවති කාර්මික සේවා කාරක සභා රැස්වීම් වාර්තාව සහ 2025.05.19 දින පැවති මහසභාව සඳහා ඉදිරිපත් කරන ලද 2026.05.06 දින පැවති කර්මාන්ත කමිටුවේ නිර්දේශ අංක 10 ඉදිරිපත් කර තිබෙනවා.

**2026.05.06 දින පැවති කර්මාන්ත කමිටුවේ නිර්දේශ අංක 10 - දිට්වා සුළි කුණාටුවෙන් හානියට පත් පළාත් පාලන මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම**

| | ව්‍යාපෘතියේ නම | ප්‍රතිපාදන මුදල රු. |
|---|---|---|
| | පාලම් | |
| 1 | බුජ්ජොමුව දුම්රියපොල හරස් මාර්ගයේ පාලම | 12,000,000.00 |
| 2 | බෝයවලාන නල්ලුර මාර්ගයේ පාලම (Bridge 01) | 10,000,000.00 |
| 3 | බෝයවලාන නල්ලුර මාර්ගය Anicut එක අසල පාලම (Bridge 03) | 10,000,000.00 |
| | මුළු වටිනාකම | **32,000,000.00** |
| | පැතිබැම් | |
| 4 | මා බෝපිටිය සුධම්ම පෙර පාසලේ පැති බැම්ම | 7,000,000.00 |
| 5 | වදාව පන්සල් මාර්ගය පැති බැම්ම | 6,000,000.00 |
| 6 | කපුවරල මාර්ගයේ පැති බැම්ම | 4,000,000.00 |
| 7 | නල්ලූර මාර්ගයේ පැතිබැම්ම | 4,000,000.00 |
| 8 | නුගවෙල පන්සල් මාර්ගයේ පැති බැම්ම | 2,200,000.00 |
| 9 | යටිගල්ඔළුව පලාගල පන්සල් මාර්ගයේ පැති බැම්ම | 3,800,000.00 |
| | මුළු වටිනාකම | **27,000,000.00** |
| | මාර්ග | |
| 10 | ඕතර කිරුම්පොල සිට බෝයවලාන දක්වා මාර්ගය(NWP ALP B9/40/8 | 1,000,000.00 |
| 11 | බඹරගල පන්සල අසල සිට පොරමඩල කණිෂ්ඨ විද්‍යාල මාර්ගය | 1,000,000.00 |
| 12 | හෙට්ටිගෙදර කනත්ත පාර | 1,000,000.00 |
| 13 | කැබැල්ලවිට සමිති ශාලා මාර්ගය | 1,000,000.00 |
| 14 | වළකුඹුර ලිහිණි ගල් මෝල අසල මාර්ගය | 1,000,000.00 |
| 15 | අලව්ව උතුර දර්ශන මහතාගේ නිවස අසල මාර්ගය | 1,000,000.00 |
| 16 | නුංගමුව කොට්ටවත්ත මාර්ගය | 1,000,000.00 |
| 17 | වැත්තෑ කන්ද නව බුදු මැදුර අසල සිට සෝදා පාළුවට ලක්වූ කොටස් සංවර්ධනය | 1,000,000.00 |
| | මුළු වටිනාකම | **8,000,000.00** |
| | **2025වර්ෂයේ වැඩ අවසන් කර ඇති ව්‍යාපෘති** | **ප්‍රතිපාදන මුදල රු.ම්.** |
| 18 | ගල්ගමුව උතුර නො.08 මාර්ගය අවශ්‍ය ස්ථාන බොරළු දැමීම. | 170,000.00 |
| 19 | පන්සල අසළින් තිබ්බොටුවාව මාර්ගය | 170,000.00 |
| 20 | වෙන්නාරුව බෝවත්ත මාර්ගය | 130,000.00 |
| 21 | උඩුමුල්ල සිට පන්සල දක්වා මාර්ගය | 110,000.00 |
| 22 | ඉහළවෙල මාර්ගය | 720,000.00 |
| 23 | පඹදෙණිය කොස්ඉන්න මාර්ගය | 210,000.00 |
| 24 | කිරිවානාපොල උඩවෙල වත්ත මාර්ගය | 410,000.00 |
| 25 | කනම්වල මීයක් කුඹුර මාර්ගය | 90,000.00 |
| 26 | මා බෝපිටිය ගල්පොත්තේපොල දක්වා මාර්ගය | 210,000.00 |
| 27 | බුජ්ජොමුව කැන්දහේන මාර්ගය | 140,000.00 |
| 28 | ගල්වාරම පන්සල අසල සිට ගුනපාල මහතාගේ නිවස සහ හදපාන් කුඹුර ඉදිරිපසින් විජිත මහතාගේ නාවස දක්වාමාර්ගය | 140,000.00 |
| 29 | පහළ වළකුඹුර ප්‍රධාන මාර්ගය හා ප්‍රජා ශාලා මාර්ගය | 30,000.00 |
| 30 | හුම්බුළුව කිරිවාන කලල්පිටිය මාර්ගය | 340,000.00 |
| 31 | අබබෝව බෝගහ කොටුව මාර්ගය | 80,000.00 |
| 32 | ඉඩංගාපොල ගම මැද මාර්ගය | 80,000.00 |
| | මුළු වටිනාකම | **3,030,000.00** |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජ්. චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, 2026.06.03 දින පැවති කාර්මික සේවා කාරක සභා රැස්වීම් වාර්තාව සහ 2025.05.19 දින පැවති මහසභාව සඳහා ඉදිරිපත් කරන ලද 2026.05.06 දින පැවති කර්මාන්ත කමිටුවේ නිර්දේශ අංක 10 අනුමත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එම්.ජ්. චන්දිමා ලක්මාලි මල්ලව ආරච්චි මැතිනිය**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.පී. චන්ද්‍රසිරි මිගාර් පතිරණ මැතිතුමා**
ගරු සභාපතිතුමනි, 2026.05.06 දින පැවති කර්මාන්ත කමිටුවේ නිර්දේශ අංක 10 හි 2025 වර්ෂයේ වැඩ අවසන් කර ඇති ව්‍යාපෘති යටතේ අනු අංක 24 හි සඳහන් "කිරිවානාපොල උඩවෙල වත්ත මාර්ගය" , "උඩවෙල වත්ත සිට කිරිවානාවත්ත" ලෙස නිවැරදි විය යුතුයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජ්. චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, දුක හිතෙන කාරණාවකුත් තියනවා. මේක ගිය සභා වාරයේදී අනුමත කරන්න තිබ්බ එක්කනේ යම් යම් අඩුපාඩු නිසා මේ සභා වාරයට අනුමත කරන්න දැම්මේ. අනු අංක 16 හි සඳහන් "නුංගමුව කොට්ටවත්ත මාර්ගය" කියලා ගත්තාහම මේකේ කාපට් මාර්ගයක් වැටෙන්නේ. ඒ නිසා මේකේ සංශෝධනයක් කරන්න කියනවා. ගිය පාර කියපු එක ඒ විදිහටම තියනවා. අනු අංක 22 හි සඳහන් "ඉහළ වෙල මාර්ගය" කියලා දාන්න එපා ඒක"වඩුවාව ඉහළවෙල මාර්ගය" කියලා නිවැරදි කරන්න. ඒකත් පෙර විදිහටම තියනවා. කපුවරල මාර්ගයත් එහෙම්ම ම තියනවා. ගල්මෝල අසලින් කියලාත් නැහැ කීවා ඒකත් එහෙම්ම ම දාලා. මේ පාරවල්වල නම් ටික වෙනස් වීම පෙර ඉදිරිපත් කරපු විදිහටම තියනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජ්.සී.පී. අතුකෝරාල මැතිතුමා**
ගරු සභාපතිතුමනි, අනු අංක 06 හි කපුවරල මාර්ගයේ පැති බැම්ම කියලා තියනවා. කපුවරල පාරවල් දහයක් විතර තියනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඒවාට පුද්ගලික නමක් දුන්නා නම් හරිනේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එම්. අකිල මධුජිත් කුමාර මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ගිය සභා වාරයේදීත් කතා වුණාලු. මම අසනීප වෙලා වාර දෙකකට ආවේ නැහැ. අනු අංක 16 හි සඳහන් "නුංගමුව කොට්ටවත්ත මාර්ගය" කියන මාර්ගයේ පැති බැම්මක් තමා ඉල්ලලා තියෙන්නේ. නමුත් මාර්ගයක් ලෙස තමා සඳහන් වෙන්නේ. තාක්ෂණික නිලධාරී තුමියත් බැලුවා කාපට් මාර්ගයක් තමා තියෙන්නේ. වෙල්වලට කැපිලා ගිහිල්ලා දැන් කාපට් එකක් ඉතිරි වෙන් නැතිවෙයිද දන් නැහැ. ඒක "පැති බැම්මක්" ලෙස නිවැරදි විය යුතුයි.

2026.05.06 දින පැවති කාර්මික සේවා කාරක සභා රැස්වීම් වාර්තාවෙහි තීරණ අංක 10 ට අදාලව දිට්වා සුළි කුණාටුවෙන් හානියට පත් පළාත් පාලන මාර්ග ප්‍රතිසංස්කරණය කිරිම යටතේ, ඉදිරිපත් කර ඇති ලැයිස්තුව ඉහත සඳහන් සංශෝධනයන්ට යටත්ව අනුමත කිරීම සුදුසු බවටත්, ඒ අනුව සහ 2026.06.03 දින පැවති කාර්මික සේවා කාරක සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

### (6.4) <u>2026.06.03 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව</u>

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
2026.06.03 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජ්. චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, 2026.06.03 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව අනුමත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එම්.ජ්. චන්දිමා ලක්මාලි මල්ලව ආරච්චි මැතිනිය**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, 2026.06.03 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාවද ඒකමතිකව සභා සම්මත විය.

**(6.5) 2026.06.03 සහ 2026.06.11 දින පැවති ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තා**

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
2026.06.03 සහ 2026.06.11 දින පැවති ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තා ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජේ. චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, 2026.06.03 සහ 2026.06.11 දින පැවති ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තා අනුමත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි එම්.ජේ. චන්දිමා ලක්මාලි මල්ලව ආරච්චි මැතිනිය**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, 2026.06.03 සහ 2026.06.11 දින පැවති ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තා ඒකමතිකව සභා සම්මත විය.

**07. ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කල ආදායම පිළිබඳ ප්‍රගති වාර්තා සහ වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම**

**(07.1) 2026 මැයි මාසය - ප්‍රා.ස 14 වියදම් වාර්තාව සහ වියදම් පූරෝකථන වාර්තාව**
**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
අලව්ව ප්‍රාදේශීය සභාවේ 2026 මැයි මාසය - ප්‍රා.ස 14 වියදම් වාර්තාව සහ වියදම් පූරෝකථන වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජේ. චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, අලව්ව ප්‍රාදේශීය සභාවේ 2026 මැයි මාසය - ප්‍රා.ස 14 වියදම් වාර්තාව සහ වියදම් පූරෝකථන වාර්තාව පිළිගැනීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි එම්.ජේ. චන්දිමා ලක්මාලි මල්ලව ආරච්චි මැතිනිය**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා

ඒ අනුව, අලව්ව ප්‍රාදේශීය සභාවේ 2026 මැයි මාසය - ප්‍රා.ස 14 වියදම් වාර්තාව සහ වියදම් පූරෝකථන වාර්තාව සභා සම්මත විය.

**(07.2) 2026 මැයි මාසය - ප්‍රා.ස. 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පූරෝකථන වාර්තාව**

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
අලව්ව ප්‍රාදේශීය සභාවේ 2026 මැයි මාසය ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පූරෝකථන වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජේ. චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, අලව්ව ප්‍රාදේශීය සභාවේ 2026 මැයි මාසය ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පූරෝකථන වාර්තාව පිළිගැනීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි එම්.ජේ. චන්දිමා ලක්මාලි මල්ලව ආරච්චි මැතිනිය**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, අලව්ව ප්‍රාදේශීය සභාවේ 2026 මැයි මාසය ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පූරෝකථන වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**08.** වෙනත් කරුණු

**8.1** අලව්ව, ගල්වාරම ලිපිනයෙහි පදිංචි ජේ.ඒ.කේ.එම්.ජයතුංග යන අය විසින් අලව්ව මහජන ක්‍රීඩාංගනයේදී 2026.10.10 වන දින රාත්‍රී 8.00 සිට අලුයම 01.00 දක්වා කාලය තුළ "Sensation Live in Concert" නමින් ප්‍රසංගයක් ඉදිරිපත් කිරීමට සැලසුම් කරගෙන යන බවත්, එහි බියර් අලෙවි සැල සහ Boy B Concept යන අංග එකතු කිරීමට අදහස් කර ඇති බවත් ඒ සඳහා අවශ්‍ය අනුමැතිය ඉල්ලා සිටින අතර වයස අවුරුදු 21න් පහල පුද්ගලයින් සඳහා මෙම අංග දෙකම සඳහා අවසර ලබා නොදීමට කටයුතු කරන බවත් සඳහන් කරමින් 2026.06.11 දින යොමු කර ඇති ලිපිය.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීවරුනි, සංගීත ප්‍රසංගයක් තියනවා. බියර් අලෙවි හලකට අවසර දෙන්න පුළුවන්ද කියලා අහනවා. පොදුවේ සභාවෙන් කතා කරලා කියන්න අවසර දෙන්න පුළුවන්ද බැරිද කියලා. තනි තීරණයක් ගන්නැතිව මේක ඉල්ලීමක් නිසා ඉදිරිපත් කරන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්. සුසිල් ප්‍රේමසිංහ මැතිතුමා**
ගරු සභාපතිතුමනි, මෙතන බියර් අලෙවි සැලක් දාන්න තමා ඉල්ලන්නේ නේද?

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීතුමනි , ඔව්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්. සුසිල් ප්‍රේමසිංහ මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එහෙම දෙන්න පුළුවන්ද?

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීතුමනි, බැහැ. ඒක තමා මහසභා තීන්දුවක් දෙන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. උද්ධාල අරුණසිරි මැතිතුමා**
ගරු සභාපතිතුමනි, සෙන්සේසන් ලයිව් කියලා ප්‍රසංගයක් පවත්වන්න අපේ භූමිය තමා ඉල්ලලා ඇත්තේ. භූමිය අපිට දෙන්න පුළුවන් නමුත් මේක ඇතුළේ මේවා කරන්න එපා කියලා කියන්න තියෙන්නේ. නමුත් මේ තීන්දුව ගන්න වෙන්නේ සුරාබදු දෙපාර්තමේන්තුවෙන් පොලිසියෙන් මැදිහත්ව තමයි.

ඒ අනුව, අලව්ව, ගල්වාරම ලිපිනයෙහි පදිංචි ජේ.ඒ.කේ.එම්.ජයතුංග යන අය විසින් ඉදිරිපත් කර ඇති ඉහත සඳහන් ඉල්ලීම් ලිපියට අනුව අලව්ව මහජන ක්‍රීඩාංගනයේදී 2026.10.10 වන දින රාත්‍රී 8.00 සිට අලුයම 01.00 දක්වා කාලය තුළ එම “Sensation Live in Concert” නම් ප්‍රසංගයක් ඉදිරිපත් කිරීම සඳහා අවසර ලබා දෙන බවත්, එහි බියර් අලෙවි සැලක් පවත්වා ගෙන යාම සඳහා අවසර ලබා දීම සුදුසු නොවන බවටත් තීරණය කරන ලදී.

**8.2 ගරු මන්ත්‍රීතුමන්ලා තුමියන්ලාගේ අදහස් ඉදිරිපත් කිරීම**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා**
ගරු සභාපතිතුමනි, සභාවම තීන්දු කරලා කොහොලාන හෝටලයක කාමර ප්‍රශ්නයක් ගැන කතා කරා. ලේකම්තුමියගෙන් ඇහුවා ඒක කාමර නැතුව දීලා තියනවා කීවා.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීතුමනි, ඔව්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා**
ගරු සභාපතිතුමනි, තාමත් ඒකේ කාමර පහසුකම් තියනවා කියලා ප්‍රදර්ශනය වෙනවා.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීතුමනි , බෝඩ් එකේද?

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඔව්.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීතුමනි, මම අවසර දීලා තියෙන්නේ සාද නිකේතනයකට අදාලව අවසරය පමණයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඕක මාස කිහිපයකට ඉහතදී ගලවලා දාන්න හැදුවේ. ඒත් නීතියක් තියන නිසා මම ඒකට ඉඩ දුන් නැහැ. ඔබතුමා කියන්න ඒ පුවරුව අයින් කරන්නද?

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීතුමනි, හරි අයින් කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ලේකම්තුමියගේ ස්ථාන මාරුවක් සම්බන්ධයෙන් ආරංචියක් ඇවිල්ලා තියනවා.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීතුමනි, මම නම් දන් නැහැ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා**

ගරු සභාපතිතුමනි, එතුමිය මෙච්චර කාලයක් සේවයක් කරා. එතුමිය යම් යම් අවස්ථාවල නිවැරදිව කටයුතු කරපු නිසා මේ සභාව හොඳ මාර්ගයේ යන්න අවස්ථාව ලැබුණා. සමහර වෙලාවට තමුන්නාන්සේලාට හිතෙන්න පුළුවන් එතුමිය වෙනත් තීන්දු ගත්තේ කියලා. ඒත් එතුමිය නිවැරදි තීරණ ගත්තේ. ඒ කටයුතුවල අපිට සාර්ථකත්වයක් දැණුනා. වැරදි තැනක හිටගන්න තිබ්බ සභාවක් හරි තැනට ගෙනාවා. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා ගරු සභාපතිතුමනි, එතුමියට තව කාලය තියන නිසා අවස්ථාවක් ඇති එතුමිය තවදුරටත් අපේ සභාවේ රඳවා ගන්න. ඒක කරන්න පුළුවන් නම් හොඳයි කියන ඉල්ලීම කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. උද්ධාල අරුණසිරි මැතිතුමා**

ගරු සභාපතිතුමනි, දිට්වා එක එනකොට ආපදා කළමනාකරණ කමිටුවක් දාලා තිබුණත් අපි එකතු වුණේ නැහැ. ආපදාවෙන් පසුව අපි රැස් වෙලා යම් යම් තීන්දු තීරණ ගත්තා. දිට්වා එක වෙලාවේත් තීන්දු තීරණ අරගෙනත් තිබුණා. අපිට ඉදිරියේදී එල්නිනෝ කියලා තත්වයක් එනවා. මගේ ඉල්ලීම ආපදා කළමනාකරණ කමිටුව ඉතාම ඉක්මනින් රැස් වෙලා අපි මේකට මුහුණ දෙන්නේ කොහොමද?, වතුර අපිට නැතුව ගියොත් මොකද කරන්නේ?, මේ වෙනකොට ජල සම්පාදනයෙන් ලයින් ගිහිල්ලා තියෙන තැන් මොනවාද? ඒ ලයින් එක ඉක්මනින් යන්න තියන තැන් මොනවාද?, ඊළඟට අපේ ජල බවුසර් තියේද?, ගම්වල ප්‍රාදේශී ලේකම් කාර්යාලවලින් දීපු වතුර ටැංකි තියනවාද?, කියලා සාකච්ඡා කරමු. වාහන හදන්න හැමදාම කර්මාන්ත කමිටුවට එනවා ඒ නිසා ජල බවුසර්වලත් අඩුපාඩු තියේ නම් ඒවා හදාගමු. ගිය සතියේ ජල කළමනාකරණ කමිටු, ආපදා කළමනාකරණ කමිටු එකතු වෙලා ගරු ජනාධිපතිතුමා තීරණ ගත්තා. ගරු සභාපතිතුමනි, ඉතා ඉක්මනින් ආපදා කළමනාකරණ කමිටුව රැස් වෙමු කියලා යෝජනා කරනවා. කමිටුවට අත හැරුණු ආයතන ටිකක් තියනවා. ඕපෝව, පොලිසිය, අලව්ව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පරිසර නිලධාරීන්, පරිපාලන ග්‍රාම නිලධාරී තුමා යන අය සම්බන්ධ කරලා හොඳ සාකච්ඡාවක් කරමු කියලා යෝජනා කරනවා.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**

ගරු මන්ත්‍රීතුමන්ලා තුමියන්ලා, අද දිනට නියමිත න්‍යායපත්‍රානුකූලව සාකච්ඡා කල යුතු කරුණු අවසන්. ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් එක් රැස් වූ ගරු උප සභාපතිතුමිය ඇතුළු සියළුම ගරු මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමියන්ලාටත්, ලේකම්තුමිය ඇතුලු කාර්ය මණ්ඩලයේ සියළු නිලධාරීන්ටත් ස්තූතිය පල කරන අතර අද දිනට නියමිත මහා සභාවේ කටයුතු නිමා කරනවා.

මෙදින ප.ව 1.00 ට පමණ සභාවේ කටයුතු නිමාවට පත් විය.

2026.06.16 දින පැවති මහසභා වාර්තාව පහත සඳහන් සංශෝධනයන්ට යටත්ව, 2026.07.21 දින පැවති මහසභාවේදී ස්ථිර කරන ලද බව සහතික කරමි.

**සංශෝධන -**

01. 2026.06.16 දින මහ සභා රැස්වීම් වාර්තාවේ සංශෝධන

මහ සභා රැස්වීම් වාර්තාවේ ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන අංක 07/15/05/10 දරණ යෝජනාවට අදාලව 23 පිටුවෙහි 03 වන ඡේදයෙහි ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා විසින් සිදු කළ අදහස් ප්‍රකාශ කිරීම යටතේ සඳහන් කරන ලද “මම” යන වචනයද ඇතුළුව එම ප්‍රකාශය පහත පරිදි නිවැරදි විය යුතු බවට ඉදිරිපත් කළ සංශෝධනය

“තව විශේෂ දෙයක් තියනවා ගරු සභාපතිතුමනි, ප්‍රාදේශීය ලේකම්ගේ සහ ඉඩම් කොමසාරිස්ගේ අවසරය ඇතිව **මම** මැනපු විල්ගමුවේ අක්කර හතේ ඉඩමට, ප්‍රාදේශීය ලේකම්ගේවත්, කාගේවත් අවසරයක් නැතුව භූ විද්‍යා එක වෙන කාගෙවත් නමකින් සල්ලි භාර ගන්නවා” යන ප්‍රකාශයෙහි, **“මම”** යන වචනයද,

**“මගේ** ඉඩමේ ඉස්සරහා මැනපු අක්කර දෙකකට, ප්‍රාදේශීය ලේකම්ගේ ලියුම නැතුව වෙන කනෙක් සල්ලි බදිනවා” යන ප්‍රකාශයෙහි **“මගේ”** යන වචනයද,

“රජයේ ව්‍යාපෘතියක් යටතේ **මට** ග්‍රවුන්ඩ් එක හදන්න තියෙද්දී ඉතිරි ටික පොදු කටයුතු සඳහා යොදා ගන්නවා” යන ප්‍රකාශයෙහි **“මට”** යන වචනයද,

**“ඔයස්”** නමින් සංශෝධනය කිරීම.

2026.07.21<br>
අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී.

සභාපති,<br>
අලව්ව ප්‍රාදේශීය සභාව,<br>
අලව්ව.